(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 3(8).]

# පාර්ලිමේන්තුවේ අංක 3 දරන

# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2026 මාර්තු 06 සිකුරාදා**

---

**2026 මාර්තු 17 අඟහරුවාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ නියෝග,— 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 71 වගන්තිය යටතේ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව සහ අදාළ නියාමන අධිකාරීන් විමසා මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 දෙසැම්බර් 29 දිනැති අංක 2469/02 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.03.03 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— දූෂණ විරෝධී පනත යටතේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිලධරයන් හා සේවා නියුක්තයන්ගේ පාරිශ්‍රමික හා සේවා කොන්දේසි තීරණය කිරීම,— දූෂණ විරෝධී පනත පැනවීමේ දී පෙර පැවති පනත් තුනක් එනම්; (26 වැනි අධිකාරය වූ) අල්ලස් පනත, 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත සහ ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 1 දරන වත්කම් බැරකම් ප්‍රකාශ කිරීමේ පනත පරිච්ඡින්න කොට ඒ වෙනුවට එම පනත්වල ඇතුළත්ව තිබූ සියලු වැරදි සම්බන්ධව කටයුතු කිරීමේ බලතල සහ වගකීම් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සතු වන පරිදි 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත බලාත්මක කර ඇති හෙයින් ද;

1994 අංක 19 දරන පනතින් ස්ථාපිත කර තිබූ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට පැවති බලතල හා වගකීම්වලට වඩා වැඩි සුවිශාල වගකීම් ප්‍රමාණයක් 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත මඟින් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට පැවරී ඇති හෙයින් ද;

එම බලතල සහ වගකීම් ක්‍රියාත්මක කිරීම සඳහා 'ඇමුණුම -I' හි දැක්වෙන කාර්ය මණ්ඩලය අවශ්‍ය වන බවට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් තීරණය කර ඇති හෙයින් ද, කොමිෂන් සභාවට පැවරී ඇති සුවිශේෂ

කාර්යයන් සැලකීමේ දී එම කාර්ය මණ්ඩලය සඳහා ඉහළ නිපුණතාවයකින් සහ අත්දැකීම්වලින් සපිරුණු නිලධාරීන් ආකර්ෂණය කර ගැනීමට සහ එවැනි නිලධාරීන් බඳවා ගැනීමට හැකිවන පරිදි පාරිශ්‍රමික ව්‍යුහයක් පැවතීම අවශ්‍යව ඇති හෙයින් ද;

2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත ප්‍රකාරව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට අවශ්‍ය බවට සලකන නිලධරයන්ගේ සහ සේවා නියුක්තයන්ගේ පාරිශ්‍රමික සහ සේවා කොන්දේසි පාර්ලිමේන්තුව විසින් අනුමත කළ යුතු බව පනතේ 26(2) වගන්තියෙහි දක්වා ඇති හෙයින් ද;

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් දූෂණ විරෝධී පනතේ 26(1) වගන්තිය යටතේ තීරණය කරන ලද 'ඇමුණුම-I' හි දැක්වෙන නිලධරයන් සහ සේවා නියුක්තයන්ගේ පාරිශ්‍රමික සම්බන්ධ යෝජනාවලියට 'ඇමුණුම-II' කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ 2025.08.11 දිනැති හා 2025.12.19 දිනැති ලිපි මඟින් මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟතාවය ලැබී ඇති බව දන්වා ඇති බැවින් ද, එම යෝජනාවලිය අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් දූෂණ විරෝධී පනතේ 26(2) වගන්තිය ප්‍රකාරව සුදුසු බවට තීරණය කර ඇති හෙයින් ද;

එම පාරිශ්‍රමික යෝජනාවලිය යටතේ වන දීමනා ගෙවීම සඳහා රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම් වල කාර්ය මණ්ඩලයට එම දීමනා හිමි ගන්වා ඇති චක්‍රලේඛ විධිවිධාන අදාළ කර ගැනීමේ දී අදාළ චක්‍රලේඛවල උක්ත දීමනා හිමි නිලධර කාණ්ඩ/තනතුරු තීරණය කිරීම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් සිදුකිරීම කළයුතු හෙයින් ද;

දූෂණ විරෝධී පනතේ 26(2) වගන්තියෙහි වන සේවා කොන්දේසි, පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් නිශ්චය කර එම රීතීන් පනතේ 32(2) සහ 157(1) වගන්ති අනුව සකස් කිරීමේ බලතල එම කොමිෂන් සභාවට පැවරිය යුතු හෙයින්ද; සහ

1994 අංක 19 දරන පනත යටතේ ස්ථාපිත කොමිෂන් සභාවේ ධුර දරන ලද සහ 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත යටතේ ස්ථාපිත කරන ලද කොමිෂන් සභාවට පත්කරනු ලබන නිලධාරීන් සහ සේවකයින් (නිලධාරීන් 63 දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවක්)දූෂණ විරෝධී පනතේ 163(2)(ඌ) වගන්තියට අනුකූලව සහ එහි දැක්වෙන පරිදි නව කොමිෂන් සභාවේ විශ්‍රාම වැටුප් සහිත සුදුසු තනතුරක (දූෂණ විරෝධී පනතේ 26(1) වගන්තිය යටතේ අනුමත කළ) හා සුදුසු වැටුප් පියවරක පිහිටුවීම, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් සිදු කළ යුතු හෙයින්;

ඒ අනුව, 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ 26(2) වගන්තිය ප්‍රකාරව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිලධරයන් හා සේවා නියුක්තයන්ගේ පාරිශ්‍රමික හා සේවා කොන්දේසි තීරණය කිරීම මෙම පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලැබිය යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය දන්වා තිබේ.)

ඇමුණුම - I

2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ 26(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් එහි කටයුතු කාර්යක්ෂම ලෙස ඉටුකිරීම සඳහා අවශ්‍ය බවට තීරණය කරනු ලබන කාර්ය මණ්ඩලය

| තනතුරු නාමය | | තනතුරු සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 01 |
| 2 | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් | 01 |
| 3 | ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ | 02 |
| 4 | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් | 06 |
| 5 | අධ්‍යක්ෂ | 09 |
| 6 | ප්‍රධාන අභ්‍යන්තර විගණක | 01 |
| 7 | ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ ජනරාල් | 16 |
| 8 | සහකාර අධ්‍යක්ෂ ජනරාල් | 58 |
| 9 | සහකාර අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ | 45 |
| 10 | අභ්‍යන්තර විගණක | 01 |
| 11 | පර්යේෂණ නිලධාරී | 03 |
| 12 | පරිපාලන නිලධාරී | 04 |
| 13 | ප්‍රවාහන නිලධාරී | 01 |
| 14 | තාක්ෂණ නිලධාරී | 01 |
| 15 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | 04 |
| 16 | ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරී | 47 |
| 17 | ජ්‍යෙෂ්ඨ දූෂණ නිවාරණ නිලධාරී | 12 |
| 18 | විමර්ශන නිලධාරී | 337 |
| 19 | දූෂණ නිවාරණ නිලධාරී | 50 |
| 20 | පුස්තකාලයාධිපති | 01 |
| 21 | භාෂා පරිවර්තක හා භාෂණ පරිවර්තක | 06 |
| 22 | නීති සහකාර | 07 |
| 23 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | 06 |
| 24 | සහකාර පුස්තකාලයාධිපති | 01 |
| 25 | දූෂණ විරෝධී කළමනාකරණ සේවා නිලධාරී ** | 113 |
| 26 | යතුරු ලේඛක හා ලඝුලේඛක | 45 |
| 27 | සන්නිවේදන සහකාර | 07 |
| 28 | රියදුරු | 69 |
| 29 | කාර්යාල කාර්ය සහයක | 117 |
| **එකතුව** | | **971** |

** දූෂණ විරෝධී පනතේ 26(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව බඳවා ගැනීමට තීරණය කර ඇති තනතුර "දූෂණ විරෝධී කළමනාකරණ සේවා නිලධාරි" වේ. මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟතාවය ලැබී ඇති බවට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් දැනුම් දී ඇති තනතුරු නාමය වන්නේ "කළමනාකරණ සහකාර" තනතුර ය. තනතුරු නාමයන් වෙනස් වුව ද පැවරෙන රාජකාරී සමාන ස්වභාවයක් ගනු ලබන බැවින් හා තවත් කරුණු ගණනාවක් සලකා බලා කොමිෂන් සභාව තීරණය කර ඇත්තේ "දූෂණ විරෝධී කළමනාකරණ සේවා නිලධාරි" යන තනතුරු නාමය වේ.

ඇමුණුම - II

දූෂණ විරෝධී පනතේ 26(2) වගන්තිය ප්‍රකාරව මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟතාවය සහිතව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂන කොමිෂන් සභාව විසින් තීරණය කරන ලදුව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද පාරිශ්‍රමික යෝජනාවලිය

01. යෝජිත වැටුප් ව්‍යුහය

| තනතුර | | වැටුප් කේතය | මූලික පියවර | වර්ෂ | 1වැනි පියවර | වර්ෂ | 2වැනි පියවර | වර්ෂ | 3වැනි පියවර | වර්ෂ | 4වැනි පියවර | උපරිම |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | AC-E 4 - 2025 | 212,000 | 10 | 4,950 | | | | | | | 261,500 |
| 2 | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්/ ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ | AC-E 3 - 2025 | 194,000 | 10 | 4,500 | | | | | | | 239,000 |
| 3 | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්/ අධ්‍යක්ෂ/ ප්‍රධාන අභ්‍යන්තර විගණක | AC-E 2 - 2025 | 176,000 | 10 | 4,250 | | | | | | | 218,500 |
| 4 | ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ ජනරාල් | AC-E 1-2 - 2025 | 151,900 | 10 | 3,900 | | | | | | | 190,900 |
| 5 | සහකාර අධ්‍යක්ෂ ජනරාල් | AC-E 1-1 - 2025 | 131,300 | 10 | 2,940 | | | | | | | 160,700 |
| 6 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ/ අභ්‍යන්තර විගණක/ පර්යේෂණ නිලධාරී | AC-E 1 - 2025 | 131,300 | 10 | 2,940 | 10 | 3,595 | | | | | 196,650 |
| 7 | පරිපාලන නිලධාරී | AC-JM 1-2 - 2025 | 74,010 | 10 | 1,360 | 18 | 2,040 | | | | | 124,330 |
| 8 | ප්‍රවාහන නිලධාරී | AC-JM 1-2 - 2025 | 74,010 | 10 | 1,360 | 18 | 2,040 | | | | | 124,330 |
| 9 | තාක්ෂණ නිලධාරී | AC-JM 1-2 - 2025 | 74,010 | 10 | 1,360 | 18 | 2,040 | | | | | 124,330 |

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 10 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | AC-JM 1-2 - 2025 | 74,010 | 10 | 1,360 | 18 | 2,040 | | | | | 124,330 |
| 11 | ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරී | AC-MA 5-3 - 2025 | 79,440 | 10 | 2,040 | 20 | 2,230 | | | | | 144,440 |
| 12 | ජ්‍යෙෂ්ඨ දූෂණ නිවාරණ නිලධාරී | AC-MA 5-3 - 2025 | 79,440 | 10 | 2,040 | 20 | 2,230 | | | | | 144,440 |
| 13 | විමර්ශන නිලධාරී | AC-MA 5-1 - 2025 | 58,740 | 10 | 1,190 | 15 | 1,360 | 11 | 1,670 | | | 109,410 |
| 14 | දූෂණ නිවාරණ නිලධාරී | AC-MA 5-1 - 2025 | 58,740 | 10 | 1,190 | 15 | 1,360 | 11 | 1,670 | | | 109,410 |
| 15 | පුස්තකාලයාධිපති | AC-MA 4 - 2025 | 64,320 | 10 | 1,360 | 15 | 1,670 | 5 | 2,040 | | | 113,170 |
| 16 | භාෂා පරිවර්තක හා භාෂණ පරිවර්තක | AC-MA 4 - 2025 | 64,320 | 10 | 1,360 | 15 | 1,670 | 5 | 2,040 | | | 113,170 |
| 17 | නීති සහකාර | AC-MA 3 - 2025 | 53,940 | 10 | 800 | 11 | 1,190 | 10 | 1,320 | 5 | 1,350 | 94,980 |
| 18 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | AC-MA 2-1 - 2025 | 50,540 | 10 | 540 | 7 | 630 | 4 | 890 | 20 | 1,190 | 87,710 |
| 19 | සහකාර පුස්තකාලයාධිපති | AC-MA 1-1 - 2025 | 46,220 | 10 | 540 | 7 | 630 | 4 | 890 | 20 | 1,190 | 83,390 |
| 20 | කළමනාකරණ සහකාර | AC-MA 1-1 - 2025 | 46,220 | 10 | 540 | 7 | 630 | 4 | 890 | 20 | 1,190 | 83,390 |
| 21 | යතුරු ලේඛක හා ලඝුලේඛක | AC-MA 1-1 - 2025 | 46,220 | 10 | 540 | 7 | 630 | 4 | 890 | 20 | 1,190 | 83,390 |
| 22 | සන්නිවේදන සහකාර | AC-MA 1-1 - 2025 | 46,220 | 10 | 540 | 7 | 630 | 4 | 890 | 20 | 1,190 | 83,390 |
| 23 | රියදුරු | AC-PL 3 - 2025 | 43,280 | 10 | 490 | 10 | 540 | 10 | 590 | 12 | 630 | 67,040 |
| 24 | කාර්යාල කාර්ය සහායක | AC-PL 1 - 2025 | 40,500 | 10 | 450 | 10 | 490 | 7 | 540 | 15 | 590 | 62,530 |

02. යෝජිත දූෂණ විරෝධී අවදානම් දීමනාව

| තනතුර | | වැටුප් කේතය | දූෂණ විරෝධී අවදානම් දීමනාව |
|---|---|---|---|
| 1 | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | AC-E 4 - 2025 | 140,000 |
| 2 | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් | AC-E 3 - 2025 | 128,750 |
| 3 | ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ | AC-E 3 - 2025 | 48,000 |
| 4 | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් | AC-E 2 - 2025 | 117,500 |
| 5 | අධ්‍යක්ෂ/ ප්‍රධාන අභ්‍යන්තර විගණක | AC-E 2 - 2025 | 44,000 |
| 6 | අධ්‍යක්ෂ (විමර්ශන) | AC-E 2 - 2025 | 70,000 |
| 7 | ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ ජනරාල් | AC-E 1-2 - 2025 | 105,250 |
| 8 | සහකාර අධ්‍යක්ෂ ජනරාල් | AC-E 1-1 - 2025 | 94,000 |
| 9 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ/අභ්‍යන්තර විගණක/ පර්යේෂණ නිලධාරී | AC-E 1 - 2025 | 33,000 |
| 10 | නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (විමර්ශන) | AC-E 1 - 2025 | 52,000 |
| 11 | පරිපාලන නිලධාරී | AC-JM 1-2 - 2025 | 19,000 |
| 12 | ප්‍රවාහන නිලධාරී | AC-JM 1-2 - 2025 | 19,000 |
| 13 | තාක්ෂණ නිලධාරී | AC-JM 1-2 - 2025 | 19,000 |
| 14 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | AC-JM 1-2 - 2025 | 19,000 |
| 15 | ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරී | AC-MA 5-3 - 2025 | 31,000 |
| 16 | ජ්‍යෙෂ්ඨ දූෂණ නිවාරණ නිලධාරී | AC-MA 5-3 - 2025 | 20,000 |

| | | | |
|---|---|---|---|
| 17 | විමර්ශන නිලධාරී | AC-MA 5-1 - 2025 | 23,000 |
| 18 | දූෂණ නිවාරණ නිලධාරී | AC-MA 5-1 - 2025 | 15,000 |
| 19 | පුස්තකාලයාධිපති | AC-MA 4 - 2025 | 16,000 |
| 20 | භාෂා පරිවර්තක හා භාෂණ පරිවර්තක | AC-MA 4 - 2025 | 16,000 |
| 21 | නීති සහකාර | AC-MA 3 - 2025 | 14,000 |
| 22 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | AC-MA 2-1 - 2025 | 13,000 |
| 23 | සහකාර පුස්තකාලයාධිපති | AC-MA 1-1 - 2025 | 12,000 |
| 24 | කළමනාකරණ සහකාර | AC-MA 1-1 - 2025 | 12,000 |
| 25 | යතුරු ලේඛක හා ලඝුලේඛක | AC-MA 1-1 - 2025 | 12,000 |
| 26 | සන්නිවේදන සහකාර | AC-MA 1-1 - 2025 | 12,000 |
| 27 | රියදුරු | AC-PL 3 - 2025 | 11,000 |
| 28 | කාර්යාල කාර්ය සහායක | AC-PL 1 - 2025 | 10,000 |

03. යෝජිත කාර්ය සාධන දීමනාව

ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරි සහ විමර්ශන නිලධාරි යන තනතුරු සඳහා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන රු. 10,000/- ක් දක්වා වන කාර්ය සාධන දීමනාවක් ගෙවීම.

04. ඉහත 02 සහ 03 හැර යෝජිත අනෙක් දීමනා

ඉහත දූෂණ විරෝධී අවදානම් දීමනාව සහ කාර්ය සාධන දීමනාවට අමතරව කොමිෂන් සභාවේ නිලධාරින් හා සේවකයන් සඳහා අනෙකුත් දීමනා (අතිකාල දීමනාව/අමතර සේවා දීමනාව හා නිවාඩු දින වැටුප්, සංයුක්ත දීමනාව, ජීවන වියදම් දීමනාව, වෘත්තීය දීමනාව, ප්‍රවාහන දීමනාව, ඉන්ධන දීමනාව සහ සන්නිවේදන දීමනාව ඇතුළු අනෙකුත් දීමනාවන්) ගෙවීමේ දී රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල කාර්ය මණ්ඩලය සඳහා එම දීමනා හිමි ගන්වා ඇති චක්‍රලේඛ විධිවිධාන අදාළ කර ගැනීම.

*

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග සංශෝධනය කිරීම,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග සංශෝධනය කිරීම සම්බන්ධයෙන් 2026 පෙබරවාරි 20 දින පාර්ලිමේන්තුවට පිළිගන්වන ලද ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ වාර්තාවේ සඳහන් මතු දැක්වෙන තත් කාරක සභා නිර්දේශ පිළිගත යුතු ය:—

**දැනට පවත්නා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) හි පළමුවැනි ඡේදයට ඉක්බිතිව ම මතු සඳහන් නව ඡේදය ඇතුළත් කිරීම:—**

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා පරීක්ෂා කිරීමේ දී බරපතල මූල්‍ය වංචා, අල්ලස් හෝ දූෂණ ක්‍රියාවන් සිදුව ඇති බවට කාරක සභාව නිගමනය කළහොත් ඒ පිළිබඳ වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ පසු පාර්ලිමේන්තුව විසින් තීරණය කරනු ලබන අවස්ථාවකදී, එකී සිද්ධීන් සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම සඳහා එකී සිද්ධීන් ඍජුව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට හෝ පොලිස්පතිවරයාට කාරක සභාව විසින් යොමු කරනු ලැබිය හැකි ය.

**දැනට පවත්නා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120(4) හි පළමුවැනි ඡේදයට ඉක්බිතිව ම මතු සඳහන් නව ඡේදය ඇතුළත් කිරීම:—**

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා පරීක්ෂා කිරීමේ දී බරපතල මූල්‍ය වංචා, අල්ලස් හෝ දූෂණ ක්‍රියාවන් සිදුව ඇති බවට කාරක සභාව නිගමනය කළහොත් ඒ පිළිබඳ වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ පසු පාර්ලිමේන්තුව විසින් තීරණය කරනු ලබන අවස්ථාවකදී, එකී සිද්ධීන් සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම සඳහා එකී සිද්ධීන් ඍජුව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට හෝ පොලිස්පතිවරයාට කාරක සභාව විසින් යොමු කරනු ලැබිය හැකි ය.

*

ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා,— ලංකා ධීවර සංස්ථාවේ වාර්ෂික වාර්තාව (2018),— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(1) වගන්තිය යටතේ 2025.02.14 දින ඉදිරිපත් කරන ලද, 2018.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ලංකා ධීවර සංස්ථාවේ 2018 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ධීවර, ජලජ සහ සාගර සම්පත් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2025.09.09 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.09.11 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2026 මාර්තු 18 බදාදා)**

1865/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ හිමිකම් සහතික ලබා දීම ක්‍රියාත්මක කරනු ලබන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කවරේද;

(ii) මේ දක්වා එම පනත යටතේ ලබාදී ඇති හිමිකම් සහතික ප්‍රමාණය කොපමණද;

(iii) ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව යටතේ මේ වනවිට සේවය කරන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ නීතිමය තත්ත්වය යාවත්කාලීන කිරීමට අපේක්ෂා කරන්නේද;

(ii) එසේ නම්, යෝජිත නීතිමය ප්‍රතිසංස්කරණ කවරේද;

(iii) එම නීතිමය ප්‍රතිසංස්කරණ කඩිනම් කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1866/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) 'Clean Sri Lanka' ජනාධිපති කාර්යසාධක බලකායේ වර්තමාන සාමාජිකයන් කවුරුන්ද;

(ii) එම ව්‍යාපෘතිය යටතේ මෙතෙක් ක්‍රියාත්මක කොට අවසන් කරන ලද ව්‍යාපෘති කවරේද;

(iii) එලෙස අවසන් කර ඇති ව්‍යාපෘති සඳහා වැය කර ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(iv) එම ව්‍යාපෘති සඳහා වැය කරන ලද මුදල් ප්‍රමාණය එක් එක් ව්‍යාපෘතිය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2024.12.19 දිනැති අංක 2415/59 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ විස්තර කර ඇති I සිට IX දක්වාවූ එක් එක් කාර්යයේ මේ වනවිට ප්‍රගතිය සහ ඒ සඳහා වැය කර ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1930/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2024 අංක 43 දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත මඟින්, සිවිල් නඩු විධාන සංග්‍රහයේ 9(අ) වගන්තිය සංශෝධනය කර පැමිණිලිකරුගේ පදිංචිය මත පදනම්ව දිසා අධිකරණයේ නඩු පැවරීම සඳහා හැකියාව ලබාදීම නුසුදුසු බවත්;

(ii) ශ්‍රී ලංකා නීතිඥ සංගමය විසින් එම 9(අ) වගන්තිය සංශෝධනය කර නීතිය පෙර පැවති තත්ත්වයට පත් කළ යුතු බවට ඉල්ලීමක් කර ඇති බවත්;

(iii) එම සංශෝධනය කඩිනමින් සිදු කරන බවට පාර්ලිමේන්තුව අමතමින් අවස්ථා කිහිපයකදී ප්‍රකාශ කර ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) එසේ නම්, ඒ සම්බන්ධයෙන් වර්තමාන ප්‍රගතිය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2026 මාර්තු 19 බ්‍රහස්පතින්දා)**

1851/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 1989.11.13 වන දින ඝාතනය කරන ලද ජනතා විමුක්ති පෙරමුණේ නිර්මාතෘ රෝහණ විජේවීර මහතාගේ මරණයෙන් පසු, ඔහුගේ බිරිඳ සහ දරුවන්ව ආරක්ෂා කිරීම සඳහා රජයේ රැකවරණය ලබාදීමට රජය විසින් කටයුතු කර තිබේද;

(ii) එසේ නම්, එලෙස රජයේ රැකවරණය ලබා දුන් තැනැත්තන්, රෝහණ විජේවීර මහතා සමඟ තිබූ ඥාති සම්බන්ධතාවය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම තැනැත්තන් රඳවාගෙන සිටි ස්ථාන කවරේද;

(iv) වර්තමානයේ රජයේ රැකවරණය සහ නඩත්තු ලබන රෝහණ විජේවීර මහතාගේ පවුලේ සාමාජිකයන් කවුරුන්ද;

(v) රෝහණ විජේවීර මහතාගේ පවුලේ සාමාජිකයන්ගේ නඩත්තුව සඳහා මෙතෙක් රජය විසින් දරා ඇති ඇස්තමේන්තුගත මුළු වියදම කොපමණද;

(vi) වර්තමානයේ රජයේ රැකවරණය ලබන එම පවුලේ සාමාජිකයන්ගේ ආරක්ෂාව සහ නඩත්තුව සඳහා මසකට රජය විසින් වැය කරනු ලබන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2026 අප්‍රේල් 10 සිකුරාදා**

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

පා. 3/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— ජාතික ක්‍රීඩා කණ්ඩායමක් නියෝජනය කරනු ලබන හෝ ජාතික මට්ටමේ වාර්තාවකට හිමිකම් කියනු ලබන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ ඕනෑම උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා අවකාශ සලසා දීම,— ශ්‍රී ලංකාවේ ඕනෑම ජාතික ක්‍රීඩා කණ්ඩායමක් නියෝජනය කරනු ලබන හෝ ජාතික මට්ටමේ වාර්තාවකට හිමිකම් කියනු ලබන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ඔවුන්ගේ මූලික අධ්‍යාපන සුදුසුකම් හෝ Z- අගය මත පදනම් නොවී ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ ඕනෑම උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා අවශ්‍ය නෛතික හා උසස් අධ්‍යාපනික ව්‍යුහය රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 4/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— ශ්‍රී ලංකාවේ සියලුම අධ්‍යාපන විද්‍යා පීඨ විශ්වවිද්‍යාල පීඨ බවට පත් කිරීම,— ශ්‍රී ලංකාවේ අධ්‍යාපන මට්ටම දියුණු ජාත්‍යන්තර තලයට ගෙන යාම උදෙසා පාසැල් පද්ධතියේ සියලුම ගුරුවරුන් පුහුණු උපාධිධාරී ගුරුවරුන් බවට පත් කිරීමට අවශ්‍ය වන හෙයින් ද, වර්තමානයේ බහුතරයක් ගුරුවරුන් හට තෙවසරක න්‍යායාත්මක හා ප්‍රායෝගික පාඨමාලාවක් අවසානයේ උසස් ඩිප්ලෝමාවක් හිමිවන හෙයින් ද, වසර තුනක න්‍යායාත්මක පාඨමාලාවක් සහ එක් වසරක පාසැල් කේන්ද්‍රීය පුහුණුවක් සහිත සිව් වසරක උපාධි පාඨමාලාවක් ප්‍රදානය කිරීම සඳහා උචිත වන සේ දැනට ක්‍රියාත්මක අධ්‍යාපන විද්‍යා පීඨ දහනවය විශ්වවිද්‍යාල පීඨ බවට පත් කිරීමට එවකට අධ්‍යාපන අමාත්‍යවරයා විසින් 2020 පෙබරවාරි 13 දින ඉදිරිපත් කොට අනුමතිය ගනු ලැබූ අමාත්‍ය මණ්ඩල තීරණය බලාත්මක කිරීම සඳහා රජය විසින් අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 5/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— මී පැණි කර්මාන්තය වැඩිදියුණු කිරීම,— ඉතා ඉහළ ඖෂධීය ගුණයෙන් යුතු, දේශීය හා විදේශීය වෙළෙඳපොළේ ඉහළ ඉල්ලුමක් ඇති මී පැණි කර්මාන්තය, දේශීය වශයෙන් වැඩිදියුණු කිරීමට කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 6/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— කැලණිවැලි දුම්රිය මාර්ගය රත්නපුර දක්වා දීර්ඝ කිරීම,— ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට වැඩිම ආදායමක් ලබා දෙන දුම්රිය මාර්ගයක් ලෙස කැලණිවැලි දුම්රිය මාර්ගය සලකනු ලබන හෙයින් ද, මෙම දුම්රිය මාර්ගය රත්නපුර දක්වා දීර්ඝ කිරීම තුළින් එහි ප්‍රතිලාභ රත්නපුර, බදුල්ල සහ හම්බන්තොට ඇතුළු දිස්ත්‍රික්ක රැසක ජනතාවට භුක්ති විඳිය හැකි වන හෙයින් ද, කැලණිවැලි දුම්රිය මාර්ගය රත්නපුර දක්වා දීර්ඝ කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 8/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— ශ්‍රී ලාංකික ආහාර සංස්කෘතිය පිළිබඳව ඉගෙනුම්, ඉගැන්වීම් ක්‍රියාවලියට බද්ධ කිරීම,— ශ්‍රී ලංකාවේ ආහාර කලාව, රසකාරක හා සංයෝග කිරීමේ කලාව, ආහාර පිසීමේ කලාව, වර්ණකාරක කලාව, ආහාර කැපීමේ කලාව ඇතුළු අංග ගණනාවකින් සමන්විත වන බැවින්, ශ්‍රී ලාංකික ආහාර සංස්කෘතිය පිළිබඳ ඉගෙනුම්, ඉගැන්වීමේ ක්‍රමවේදයන් හරහා අනාගත පරපුරට පවරාදීම මඟින් දේශීය හා විදේශීය ජනතාව අතර අප රටේ ආහාර සංස්කෘතිය ව්‍යාප්ත කිරීමට මෙන්ම ශ්‍රී ලාංකීය අනන්‍යතාවය ලෝකය තුළ ඔසවා තැබීමට සුදුසු වැඩපිළිවෙළක් රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 9/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— පාසල් දරුවන්ගේ වටිනාකම සමාජගත කිරීම,— පාසැල් දරුවන් නිරන්තරයෙන් ඇසුරු කරන දෙමාපියන්, ගුරුවරුන්, ක්‍රීඩා පුහුණුකරුවන්, පාසැල් වෑන් රථ රියැදුරන් ආදී පුද්ගලයන්ට දරුවන්ගේ වටිනාකම පිළිබඳ සමාජ විද්‍යාත්මක හා මනෝ විද්‍යාත්මක ක්‍රමවේද තුළින් සරලව පැහැදිලි කර රටේ හා සමාජයේ ඉදිරි යහපැවැත්ම වෙනුවෙන් දරුවන් සමාජ අභියෝග හමුවේ ආරක්ෂා කළ යුතු ආකාරය පිළිබඳ දැනුම්වත් කිරීමේ ජාතික මට්ටමේ වැඩසටහනක් රජය විසින් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 10/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— වතුකර ප්‍රදේශවල ක්‍රීඩා ක්ෂේත්‍රය දියුණු කිරීම,— වතුකර ප්‍රදේශවල ජීවත්වන තරුණ තරුණියන් ක්‍රීඩා ක්ෂේත්‍රයේ ජාතික හා ජාත්‍යන්තර මට්ටමෙන් තමන්ගේ හැකියාවන් ප්‍රදර්ශනය කර ඇති හෙයින් ද, ඔවුන් අධ්‍යාපනය හදාරන වතු පාසල්වල මෙන්ම ජීවත්වන වතු ප්‍රදේශවල ද ක්‍රීඩා ක්ෂේත්‍රය සඳහා කිසිදු පහසුකමක් නොමැති හෙයින් ද, රටේ ක්‍රීඩා ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම පිණිස වතුකර ප්‍රදේශවල තරුණ තරුණියන්ගේ දායකත්වය ලබා ගැනීම සඳහා ප්‍රදේශයට අදාළ ක්‍රීඩා සංවර්ධනය උදෙසා වැඩසටහනක් දියත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 16/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— ශ්‍රී ලංකා විදේශ සේවයේ පත්වීම් ලබාදීම විධිමත් කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය ජාත්‍යන්තර ප්‍රජාව ඉදිරියේ ඔසවා තබන විදේශ සේවය සඳහා සිදු කරන ලද දේශපාලන පත් කිරීම් හේතුවෙන් එම සේවයේ ගුණාත්මකභාවය බිඳ වැටී අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට නොහැකි වී තිබෙන හෙයින් එම තත්ත්වය වළක්වාලීම සඳහා විදේශ සේවයට සිදු කරනු ලබන සියලුම පත් කිරීම් තරඟ විභාග ප්‍රතිඵල සහ කුසලතාවය මත සිදු කිරීමට රජය විසින් වැඩසටහනක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 17/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— ලංගම ඩිපෝ සඳහා භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට නිසි ප්‍රසම්පාදන ක්‍රමවේදයක් සකස් කිරීම,— ලංගම ඩිපෝ සඳහා භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට නිසි ප්‍රසම්පාදන ක්‍රමවේදයක් නොමැති වීම, ලංකා ගමනාගමන මණ්ඩලයේ පවතින දූෂිත තත්ත්වයට ප්‍රධාන හේතුවක් වන හෙයින් මෙම තත්ත්වය වළක්වා ගැනීම සඳහා සුදුසු ප්‍රසම්පාදන ක්‍රමවේදයක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 18/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය පිළිබඳව පාසල් සිසුන් දැනුම්වත් කිරීමේ වැඩසටහනක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික විශ්වවිද්‍යාල රාමුවෙන් බැහැරව, රැකියා වෙළඳපොළ හා වෘත්තීය තාක්ෂණය ඉලක්ක කොටගත් වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ පාඨමාලා පිළිබඳව පාසල් සිසුන් දැනුම්වත් කිරීමේ වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 20/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් සභා සතු විෂයයන් විද්‍යානුකූල ක්‍රමවේදයකට සකස් කිරීම,— වර්තමානය වනවිට පළාත් සභා සතු විෂයයන් කිසිදු විද්‍යානුකූල පදනමක් නොමැති ආකාරයකට වෙන් කර තිබෙන හෙයින් ද, එමඟින් විවිධ ගැටලු මතු වී තිබෙන හෙයින් ද, මෙම තත්ත්වය වළක්වා ගැනීම සඳහා එම විෂයයන් විද්‍යානුකූල පදනමක් මත නිසි ක්‍රමවේදයකට වෙන් කර දැක්වීමට සුදුසු වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 21/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— ලංකා ගමනාගමන මණ්ඩලය ශක්තිමත් කිරීම සඳහා නිසි ක්‍රමවේදයක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ පොදු ප්‍රවාහන සේවාව ශක්තිමත් කිරීම අත්‍යවශ්‍ය කරුණක් හෙයින්, ලංකා ගමනාගමන මණ්ඩලය විසින් භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේ දී සිදුවන වංචා හා දූෂණ වළක්වා ගැනීම සඳහා නිසි ක්‍රමවේදයක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 22/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— කිරි නිෂ්පාදනය ඉහළ දැමීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— වාර්ෂිකව කිරි ආනයනය කිරීම සඳහා විශාල වශයෙන් විදේශ විනිමය මෙරටින් බැහැර වන හෙයින් මෙම තත්ත්වය වළක්වාලීම සඳහා ශ්‍රී ලංකාවේ කිරි නිෂ්පාදනය ඉහළ දැමීමේ වැඩසටහනක් රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 26/2024

ගරු රවී කරුණානායක මහතා,— ශ්‍රී ලංකාවේ ක්‍රීඩා ආයතන දේශපාලනීකරණයෙන් තොර කිරීම,— ශ්‍රී ලංකාවේ ක්‍රීඩා ආයතන දැඩි ලෙස දේශපාලනීකරණය වී ඇති බව පෙනී යන බැවින්, ඡන්දයෙන් තේරී පත් වන දේශපාලනඥයින් ක්‍රීඩා ආයතනවල නායකත්ව තනතුරු සඳහා තරග කිරීම සහ ඒවා හෙබවීම තහනම් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 30/2025

ගරු රවී කරුණානායක මහතා,— වාර්ගිකත්වය සහ ආගමික පදනම අනුව දේශපාලන පක්ෂ නම් කිරීම තහනම් කිරීම,— වාර්ගිකත්වය සහ ආගමික පදනම අනුව දේශපාලන පක්ෂ නම් කිරීම තහනම් කළ යුතු බවටත් ශ්‍රී ලංකාවේ දැනට උද්ගතව තිබෙන තත්ත්වය සැලකිල්ලට ගනිමින් වාර්ගික හෝ ආගමික පදනමක් දක්වන නම් දරන දැනට පවතින දේශපාලන පක්ෂ වලට ද එවැනි වෙනසක් ක්‍රියාත්මක කළ යුතු බවටත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 31/2025

ගරු රවී කරුණානායක මහතා,— උද්ධමනයට සාපේක්ෂව 1%ක ප්‍රතිලාභයක් සේවකයින්ට ගෙවීම,— රජයේ ආයතන විසින් පරිපාලනය කරනු ලබන සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාර අරමුදල විසින් වාර්ෂික උද්ධමන අනුපාතයට වඩා අවම වශයෙන් 1%කින් ඉහළ ප්‍රතිලාභ සේවා නියුක්තිකයින්ට ලැබෙන බවට වගබලා ගත යුතු බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 32/2025

ගරු රවී කරුණානායක මහතා,— ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා නොමිලේ ගමන් පහසුකම් සැපයීම,— සියලුම ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා පොදු ප්‍රවාහන සේවා තුළ නොමිලේ ප්‍රවාහන පහසුකම් සැපයිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 33/2025

ගරු රවී කරුණානායක මහතා,— සංක්‍රමණික සේවකයින් විසින් මුහුණ දෙනු ලබන ගැටළු විසඳීම සඳහා නීතිමය බලතල සහිත ඒකකයක් පිහිටුවීම,— සංක්‍රමණික සේවකයින් විසින් මුහුණ දෙනු ලබන පහරදීම, පැහැර ගැනීම, ස්ත්‍රී දූෂණය, ලිංගික අපයෝජනය, මනුෂ්‍ය ඝාතනය හා මූල්‍ය වංචා ඇතුළු ගැටළු පිළිබඳව සොයා බැලීමට සහ බලපෑමට ලක් වූ සේවකයින්හට ශ්‍රී ලංකාවට ආරක්ෂිතව නැවත පැමිණීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීමට සහ ඔවුන්ගේ ආරක්ෂාව පිළිබඳව කටයුතු කිරීමට නීතිමය බලතල සහිත ඒකකයක් පිහිටුවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 34/2025

ගරු රවී කරුණානායක මහතා,— නව නිපැයුම්කරුවන් ලෝකයට හඳුන්වාදීම සඳහා ජාතික වැඩසටහනක් සකස් කිරීම,— විවිධ කුසලතාවලින් පිරිපුන් නව නිපැයුම්කරුවන් සහ පුරවැසියන් ලෝකයට හඳුන්වාදීම සඳහා සහ ඔවුන්ගේ කුසලතා සහ නිර්මාණ වැඩිදියුණු කිරීම සඳහා ජාතික වැඩසටහනක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 35/2025

ගරු රවී කරුණානායක මහතා,— දේශීය අමුද්‍රව්‍ය භාවිතා කරන කර්මාන්තකරුවන්ට බදු සහන,— ජාත්‍යන්තර වෙළඳපොළ සඳහා භාණ්ඩ නිෂ්පාදනය කිරීමේදී, 75% කට වඩා දේශීය අමුද්‍රව්‍ය භාවිතා කරන දේශීය කර්මාන්තකරුවන්ට, වසර දෙකක බදු සහනයක් ලබා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 36/2025

ගරු රවී කරුණානායක මහතා,— ඡන්දය ප්‍රකාශ කිරීමට ඇති අයිතිය ලබා දීම,— ලියාපදිංචි ඡන්දදායකයින් වැඩි සංඛ්‍යාවකට ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා ඇති අයිතිය අහිමි වී ඇති හෙයින් වඩාත් සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලියක් නිර්මාණය කිරීම උදෙසා වයස අවුරුදු දහ අටට වැඩි සෑම පුද්ගලයෙකුටම ඡන්දය ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දීමටත්, ඡන්ද හිමි නාමලේඛනයේ නම සඳහන් වීමෙන් පසු යම් පුද්ගලයෙකු ඡන්දය ප්‍රකාශ නොකරන්නේ නම් ඔවුන්ට දඩ නියම කිරීමටත් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 39/2025

ගරු ලාල් ප්‍රේමනාත් මහතා,— බිම් මට්ටමේ පවතින සියලුම පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් ඇති ජනතා අප්‍රසාදය වළක්වා ගැනීමට කටයුතු කිරීම,— ජනතාවට වඩාත්ම සමීපතම මහජන නියෝජිත ආයතන වන බිම් මට්ටමේ පවතින සියලුම පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් බොහෝවිට ජනතාව තුළ ඉතාමත් අසතුටුදායක හැඟීමක් පවතින හෙයින් එම ආයතන පිළිබඳ වැඩි අවධානයක් ලබා දීමට රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 41/2025

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ව්‍යවස්ථාව ඇතුළු සංයුතිය වෙනස් කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— වර්තමානය වනවිට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සම්බන්ධව සමාජයේ විශාල කතිකාවක් නිර්මාණය වී තිබෙන හෙයින්ද, එහි නිලවරණයේ දී එක්තරා සමිති කණ්ඩායමක් සතුව ක්‍රිකට් ආයතනයේ බලය පැවතීම හේතුවෙන් අක්‍රමිකතා බහුලව සිදුවන ආයතනයක් බවට පත්වී ඇති හෙයින් එම තත්ත්වය වළක්වා ගැනීම සඳහා ක්‍රිකට් ආයතනයේ ව්‍යවස්ථාව ඇතුළු සංයුතිය සංශෝධනය කිරීමට රජය විසින් අවශ්‍ය කටයුතු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 43/2025

ගරු රෝහණ බංඩාර මහතා,— මහාචාර්ය, ආචාර්ය තනතුරු අවභාවිත කිරීම වළක්වා ගැනීමට වැඩපිළිවෙළක් සකස් කිරීම,— වර්තමානයේ අප සමාජයේ බොහෝ පිරිස් මහාචාර්ය, ආචාර්ය වැනි තනතුරු හා නාමයන් අවභාවිත කරන හෙයින් එම තත්ත්වය වළක්වා ගැනීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හරහා වැඩසටහනක් සකස් කිරීමට රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 44/2025

ගරු චමින්ද විජේසිරි මහතා,— ශ්‍රී ලංකා වරාය අධිකාරිය සම්බන්ධයෙන් 2023 වර්ෂයේ විගණන වාර්තාවේ දැක්වෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීම,— ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ හදවත බඳු ශ්‍රී ලංකා වරාය අධිකාරිය සම්බන්ධයෙන් ඉතා වැදගත් නිර්දේශ ජාතික විගණන වාර්තාවේ දක්වා ඇති හෙයින් එම නිර්දේශ ක්‍රියාවට නැංවීමට විධිමත් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 45/2025

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් පාලන ආයතනවල මුදල් නිසි ලෙස මහජන සේවා සඳහා යෙදවීම,— වර්තමානය වනවිට බොහෝ පළාත් පාලන ආයතන සිය මුදල් නිසි ලෙස මහජන, සෞඛ්‍ය පොදු සේවා සහ පොදු මාවත් දියුණු කිරීම වැනි කටයුතු සඳහා නොයොදවා ලාභ ඉපැයීමේ අරමුණින් ස්ථාවර තැන්පතුවල තැන්පත් කොට ඇති බවට කරුණු අනාවරණය වී ඇති හෙයින් එම තත්ත්වය වළක්වා ගැනීමට රජය විසින් සුදුසු වැඩසටහනක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 48/2025

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— ඛනිජ තෙල්, ඉන්ධන හා ජලය පිළිබඳ කර්මාන්ත ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ නියාමනයට යටත් කිරීම,— විදුලිය, ඛනිජ තෙල්, ඉන්ධන හා ජලය පිළිබඳ කර්මාන්ත නියාමනය කළ යුතු වුවත්, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය අධීක්ෂණය කිරීම සඳහා අදාල පනත් සංශෝධනය නොකිරීම හේතුවෙන් වසර 21කට වැඩි කාලයක සිට ඛනිජ තෙල් සහ ජලය යන කර්මාන්ත නියාමනයට යටත් නොවී තිබෙන තත්ත්වය වෙනස් කිරීම සඳහා අදාළ නීතිමය කටයුතු සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 49/2025

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— ඉන්ධන පිරවුම්හල් සඳහා බලපත්‍ර ලබාදීමේ ක්‍රියාදාමය නියාමනය කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ ඉන්ධන පිරවුම්හල් බලපත්‍ර ලබාදීමේ ක්‍රියාදාමය දැඩි අවිධිමත් තත්ත්වයක පවතින බැවින්, එම තත්ත්වය විධිමත් කිරීම සඳහා නියාමන වැඩසටහනක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 50/2025

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා,— ෆයිනස් වගාවන් හේතුවෙන් ජල මූලාශවලට සහ පරිසරයට සිදුවන හානිය වැළැක්වීමට ක්‍රමවේදයක් සකස් කිරීම,— විශේෂයෙන්ම ඌව පළාත ඇතුළුව කඳුකර ප්‍රදේශවල වගා කර ඇති ෆයිනස් වගාවන් හේතුවෙන් ජල මූලාශවලට සහ පරිසරයට සිදුවන හානිය පිළිබඳව සලකා බලා ඒවා ඉවත් කර ප්‍රයෝජනවත් දේශීය වගාවන් සිදු කිරීමට ක්‍රමවේදයක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 51/2025

ගරු රවී කරුණානායක මහතා,— ජාතික භාෂා පීඨයක් පිහිටුවීම,— ගුරුවරුන් සඳහා සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා උගන්වනු පිණිස ජාතික භාෂා පීඨයක් පිහිටුවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 52/2025

ගරු චමින්ද විජේසිරි මහතා,— ක්ෂුද්‍ර මූල්‍ය ණය ලබාගත් ණය වින්දිතයින් බවට පත් වූ පුද්ගලයින්ට සාධාරණය ඉටු කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— ක්ෂුද්‍ර මූල්‍ය ණය ලබාගත් පිරිසෙන් අති බහුතරයක් මේ වනවිට ණය වින්දිතයින් බවට පත්ව සිටින බැවින්, එම පිරිසට සාධාරණය ඉටු කිරීම සඳහා වැඩසටහනක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 53/2025

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— ටෙලි නාට්‍ය කර්මාන්තය දියුණු කිරීම සඳහා සහ එම කර්මාන්තය නියාමනය කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— ජනතාවට විනෝදාස්වාදය සපයන ප්‍රධාන කර්මාන්තයක් වන ටෙලි නාට්‍ය කර්මාන්තය

දියුණු කිරීම සඳහා සහ එම කර්මාන්තය නියාමනය කිරීම සඳහා යම් නියාමන ආයතනයක් ස්ථාපිත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 54/2025

ගරු ලාල් ප්‍රේමනාත් මහතා,— පළාත් පාලන ආයතන තුළ මහා පරිමාණයෙන් මහජන මුදල් අවභාවිතා කළ තැනැත්තන්ට එරෙහිව පියවර ගැනීම,— ශ්‍රී ලංකාව පුරා පිහිටි සියලුම පළාත් පාලන ආයතනයන්හි පසුගිය කාලය තුළ මහා පරිමාණයෙන් මහජන මුදල් අවභාවිතා වීම සම්බන්ධව කඩිනමින් පරීක්ෂණ පවත්වා ඒ සඳහා දායක වූ සියලුම බලධාරින්ට පවත්නා නීතිය අනුව දඬුවම් ලබා දීමට කටයුතු කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 55/2025

ගරු උපුල් කිත්සිරි මහතා,— රත්නපුර දිස්ත්‍රික්කයේ කොලොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මඩුවන්වෙල වලව්ව ප්‍රමුඛ ශ්‍රී ලංකාවේ ඓතිහාසික වටිනාකමින් යුත් ස්ථාන ආරක්ෂා කිරීම,— රත්නපුර දිස්ත්‍රික්කයේ කොලොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ඓතිහාසික ස්ථානයක් වන මඩුවන්වෙල වලව්ව ප්‍රමුඛ ශ්‍රී ලංකාවේ ඓතිහාසික වටිනාකමින් යුත් ස්ථාන බොහෝ ප්‍රමාණයක් පවතින හෙයින් ද, එම ස්ථාන සංචාරක ආකර්ශණයට ලක් වී ඇති හෙයින් ද, වර්තමානය වනවිට එවැනි ස්ථාන දැඩි අනාරක්ෂිත තත්ත්වයට පත් වී ඇති හෙයින් ද, මෙම ස්ථානවල මුල් පෞරාණිකභාවයට හානියක් නොවන ලෙස සංරක්ෂණය කොට එම ස්ථාන සතු ඉඩම් කඩිනමින් මැන නිරවුල් කොට අනාගත පරපුර සඳහා ආරක්ෂා කර දෙමින් සංචාරක කර්මාන්තයට යොදා ගැනීම සඳහා ඒවා ආරක්ෂා කිරීමට වැඩපිළිවෙළක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 56/2025

ගරු උපුල් කිත්සිරි මහතා,— උඩවලව ප්‍රදේශය සංචාරක කලාපයක් ලෙස නම් කිරීම, — උඩවලව ජාතික වනෝද්‍යානය, උඩවලව ඇත් අතුරු සෙවණ, සංඛපාල රජමහා විහාරය, උඩවලව ජලාශය, සෙවනගල සීනි කර්මාන්තශාලාව, සෙවනගල උක් පර්යේෂණ ආයතනය, උඩවලව මිරිදිය ධීවර මධ්‍යස්ථානය සහ වවුල්පන හුණුගල් ගුහාව ආදී වූ සංචාරක ආකර්ශණය ලබාගත හැකි ස්ථාන තිබුණද විධිමත් වැඩපිළිවෙළක් නොමැතිවීම හේතුවෙන් දෙස් විදෙස් සංචාරකයන්ට එහි වටිනාකම් ලබාගැනීමට නොහැකි වී ඇති හෙයින් රත්නපුර දිස්ත්‍රික්කයේ උඩවලව ප්‍රදේශය සහ මොනරාගල දිස්ත්‍රික්කයේ සෙවනගල ප්‍රදේශය ආවරණය වන පරිදි උඩවලව ප්‍රදේශය සංචාරක කලාපයක් ලෙස නම් කිරීම සඳහා රජය විසින් සුදුසු පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 57/2025

ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා,— "ශ්‍රී ලංකා බයිතුල්මාල් අරමුදල" නමින් අරමුදලක් ආරම්භ කිරීම,— ශ්‍රී ලංකාව තුළ ජීවත්වන මුස්ලිම් ජනතාවගේ අධ්‍යාපනය, සංස්කෘතිය, රැකියාව සහ ජාතීන් අතර පවතින සහයෝගීතාවය සම්බන්ධ ගැටලුවලදී හා එදිනෙදා ජීවනෝපායයන් ඉටුකර ගැනීමේ දී අවශ්‍ය වන

අරමුදලක් මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව සතුව දැනට නොමැති හෙයින් ද, මෙම අවශ්‍යතාවයන් සඳහා "බයිතුල්මාල්" නමින් අරමුදලක් ලෝකයේ මුස්ලිම් රටවල්වල සහ මුස්ලිම් සුළු ජාතීන් ජීවත්වන රටවල්වල වසර ගණනාවක සිට ස්ථාපනය කර ඇති හෙයින් ද, මෙම අරමුදල ශ්‍රී ලංකාවේ ආරම්භ කළහොත් අවශ්‍ය මුදල් ප්‍රතිපාදන මෙරට ජීවත්වන අයගෙන් සහ විදේශීය රටවල්වල ජීවත්වන අයගෙන් සම්පාදනය කරගත හැකිවන හෙයින් ද, මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ "ශ්‍රී ලංකා බයිතුල්මාල් අරමුදල" නමින් අරමුදලක් ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදුකරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 58/2025

ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය,— පාසල් සිසුන්ගේ අධ්‍යාපන සංවර්ධනය, වෘත්තීය සංවර්ධනය සහ පුද්ගල සමාජ සංවර්ධනය සඳහා සෑම පාසලකටම පුහුණුවලත් මනෝ උපදේශකවරයෙකු (Student Counsellor) පත් කිරීම,— වර්තමානයේ බොහෝ පාසල් සිසුන් අතර විවිධ මානසික පසුබෑම් දක්නට ලැබෙන හෙයින් ද, මෙම තත්ත්වයන් ඔවුන්ගේ ශාරීරික හා සමාජීය පැවැත්ම සඳහා වක්‍රාකාරව බලපාන හෙයින් ද, ඇතැම් අවස්ථාවලදී පාසල් සඳහා පාසල් මනෝ උපදේශකවරයන් පත් කර තිබුණ ද එම තනතුර සඳහා පාසල් ගුරුවරුන්ගේ භූමිකාවද ඇතුළත්වීම හරහා ඉන් බලාපොරොත්තු වන සේවය ඵලදායීව සිදු වී නොමැති හෙයින් ද, සෑම පාසලකටම මනෝ උපදේශකයකවරයෙකුගේ අවශ්‍යතාවය මතු වී ඇති හෙයින් ද, පාසල් සිසුන්ගේ අධ්‍යාපන සංවර්ධනය, වෘත්තීය සංවර්ධනය හා පුද්ගල සමාජ සංවර්ධනය සඳහා සෑම පාසලකටම පුහුණුවලත් මනෝ උපදේශකවරයෙකු පත් කිරීමට අවශ්‍ය පියවර රජය විසින් ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 59/2025

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් වන "රටවිරුවන්" වෙනුවෙන් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ ජාතික ආර්ථිකය පණ ගැන්වීම සඳහා විදෙස්ගත ශ්‍රමික ප්‍රජාවගෙන් ලැබෙන දායකත්වය ඉතා සුවිශේෂ වන හෙයින් ද, ආර්ථික අර්බුදය හමුවේ විදෙස් රටවල වසර ගණනාවක් රැකියා කිරීමෙන් අනතුරුව නැවත ශ්‍රී ලංකාවට පැමිණ තම දූ දරුවන්ද සමඟින් ජීවිකාව ගෙන යන ඔවුන්ට ඇතැම් අවස්ථාවලදී නැවත රැකියාවක් කිරීමට තරම් හැකියාවක් නොමැතිවීම හේතුවෙන් විවිධ ගැටලුවලට මුහුණපෑමට සිදුවන හෙයින් ද, ඔවුන්ගෙන් විදේශ විනිමය වශයෙන් ලැබෙන මුදලින් යම් ප්‍රතිශතයක් යොදාගෙන විශ්‍රාම අරමුදලක් පිහිටුවා විශ්‍රාම යෝජනා ක්‍රමයක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 60/2025

ගරු ලාල් ප්‍රේමනාත් මහතා,— තරුණ දරුවන් විසින් සිය දිවි හානි කර ගැනීම වළක්වා ගැනීම,— පසුගිය කාලය තුළ සෑම පාසලකම උපදේශනය සඳහා ගුරුවරුන් පුහුණු කිරීම, සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකම උපදේශන අංශයක් පිහිටුවීම, සෑම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකම උපදේශන ඒකකයක් පිහිටුවීම, රාජ්‍ය සහ පෞද්ගලික විශ්වවිද්‍යාලවල උපදේශන ඩිප්ලෝමා පාඨමාලා, උපාධි පාඨමාලා, පශ්චාත් උපාධි පාඨමාලා පැවැත්වීම,

මානසික අවපීඩන තත්ත්වයන්ට විසඳුම් සෙවීම සඳහා සෑම ප්‍රධාන රෝහලකම මානසික වෛද්‍ය ඒකක පිහිටුවීම ආදිය මඟින් තරුණ දරුවන් සිය දිවි හානි කර ගැනීම වළක්වා ගැනීමට ගත් ක්‍රියාමාර්ග අසාර්ථක වී ඇති හෙයින් දේශපාලන අධිකාරිය, රජයේ නිලධාරීන්, විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය සහ මහජනතාව එකී ක්‍රියාමාර්ග කෙරෙහි ගැඹුරින් මැදිහත් විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 61/2025

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතිය තුළ පිහිටි ආපනශාලාවන්හි ළමුන්ට අහිතකර ආහාර අලෙවි කිරීම නතර කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ පාසල් දරුවන් අතර දියවැඩියාව රෝගය බහුල වශයෙන් හඳුනාගෙන ඇති බව විශේෂඥ වෛද්‍යවරුන් පෙන්වා දී තිබෙන හෙයින්ද, දියවැඩියාව රෝගය සඳහා ආහාර වර්ග මෙන්ම ආහාර පුරුදු සහ ආහාර රටාව හේතු වන හෙයින්ද, ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතිය තුල පිහිටි පාසල් ආපනශාලාවන්හි දියවැඩියාව සඳහා හේතු වන්නා වූ සීනි සහ පිටි සහිත ආහාර මෙන්ම ෆ්‍රයිඩ් රයිස්, කොත්තු, ක්ෂණික නූඩ්ල්ස් වැනි ආහාර වර්ග ඉතා විශාල වශයෙන් පාසල් ළමුන්ට අලෙවි කරන හෙයින්ද, අප රටේ පාසල් දරුවන් අතර දියවැඩියා රෝගී තත්ත්වය පාලනය කිරීම සඳහා පාසල් ආපනශාලාවල අළෙවි කළ යුතු ආහාරපාන වර්ග පිළිබඳව රජය විසින් යම් සීමාවන් පැනවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 62/2025

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— දුම්රිය මඟින් භාණ්ඩ ප්‍රවාහනය කාර්යක්ෂම කිරීම,— ශ්‍රී ලංකාවේ දුම්රිය සේවය ආරම්භ කිරීමේ මුඛ්‍ය පරමාර්ථය වූයේ භාණ්ඩ ප්‍රවාහනය හෙයින්ද, මේ වනවිට දුම්රිය සේවය එයින් බැහැර වී ඇති හෙයින්ද, දුම්රිය මඟින් භාණ්ඩ ප්‍රවාහනය වියදම් අඩු ක්‍රමයක් වන හෙයින්ද, එහි ප්‍රතිලාභ රටේ ජනතාවට සෘජුවම අත්වන හෙයින්ද, හැකි සෑම අවස්ථාවකදීම දුම්රිය මඟින් භාණ්ඩ ප්‍රවාහනය මෙන්ම ඉන්ධන ප්‍රවාහනය සඳහා රජය විසින් නිසි ක්‍රමවේදයක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 63/2025

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— සිය කෘෂි නිෂ්පාදන අළෙවි කිරීමේදී ගොවීන්ට සිදුවන අසාධාරණය අවම කිරීම,— සිය කෘෂිකාර්මික නිෂ්පාදන අලෙවි කිරීමේදී තොග වෙළඳුන් මෙන්ම සිල්ලර වෙළඳුන් විසින් ද ඉතා අඩු මුදලක් නියම කිරීම හේතුවෙන් මෙරට ගොවීන් බරපතල අසාධාරණයකට ලක්වන හෙයින්ද, එකී භාණ්ඩ වෙළඳුන්ගෙන් මිලදී ගැනීමේදී පාරිභෝගික ජනතාවට වැඩි මිලක් ගෙවීමට සිදුව ඇති හෙයින්ද, ගොවියාත්, පාරිභෝගිකයාත් එකවර අසාධාරණයන්ට ලක් කරන්නා වූ මෙකී ක්‍රියාදාමයන් වෙනස් කරමින්, ගොවියාට සහ පාරිභෝගිකයාට සාධාරණයක් ඉටු කර දීම වෙනුවෙන් රජය විසින් කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 64/2025

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— පෙර පාසල් අධ්‍යාපනය නියාමනය කිරීමේ ක්‍රමවේදයක් සකස් කිරීම,— මේ වනවිට ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක සියලුම අධ්‍යාපන අවස්ථා අතරින් පෙර පාසල් අධ්‍යාපනය අතිශය වැදගත් සහ තීරණාත්මක වන හෙයින්, ශ්‍රී ලංකාවේ පෙර පාසල් අධ්‍යාපනය එක් ආයතනයකින් නියාමනය කිරීමේ ක්‍රමවේදයක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 65/2025

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— අපනයන නිෂ්පාදකයින්ට පහසුකම් සැපයීම,— අපනයනය ඉලක්ක කර ගනිමින් කෘෂිකාර්මික සහ වෙනත් භාණ්ඩ නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදකයන්ට අපනයන වෙළඳපොළට ප්‍රවේශ වීම සඳහා ප්‍රමාණවත් තරම් පහසුකම්, දැනුම සහ ප්‍රවේශ මාර්ග නොමැති හෙයින්, විදේශ විනිමය උත්පාදනයේ ප්‍රධාන සංරචකයන් වන අපනයන ක්ෂේත්‍රයේ නියැළි තරුණ ව්‍යවසායකයින්ට ඒ සඳහා අවශ්‍ය පහසුකම් ලබා දීමට පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 66/2025

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— උසස් පෙළ විද්‍යා, වාණිජ සහ තාක්ෂණවේදය විෂය ධාරාවන්ට සාහිත්‍යය විෂය හඳුන්වා දීම,— ශ්‍රී ලංකාවේ පාසල්වල විද්‍යා, වාණිජ සහ තාක්ෂණවේදය විෂය ධාරාවන්ගෙන් උසස් පෙළ හදාරන සිසුන්ගේ සාහිත්‍ය රසාස්වාදය ඉහළ නැංවීම සඳහා එම විෂය ධාරාවන් සඳහා අමතර විෂයයක් ලෙස සාහිත්‍යය විෂය හඳුන්වා දියයුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 67/2025

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— රෝහල්වල නේවාසික රෝගීන්ට උපස්ථානය සැලසීම,— රෝහලක නේවාසිකව ප්‍රතිකාර ලබන රෝගියෙකු අසල, රෝගියාගේ රැකවරණය සඳහා දිවා හා රාත්‍රී කාලයන්හි භාරකරුවෙකු නතර කළ යුතු බවට වාට්ටු භාර හෙද නිලධාරින් විසින් දැනුම් දෙනු ලබන හෙයින්ද, එලෙස භාරකරුවෙකු නොමැති අවස්ථාවකදී පෞද්ගලික උපස්ථාන සේවකයින් ගාස්තු ගෙවා ලබා ගත යුතුව ඇති හෙයින්ද, එකී උපස්ථාන සේවකයින් දිනකට රු. 3500 ක පමණ මුදලක් අය කරන හෙයින්ද, දින කිහිපයක් රෝහල් ගතව සිටීමට සිදු වුවහොත් එය දරා ගැනීමට අපහසු මුදලක් වන හෙයින්ද, රෝහලක නේවාසිකව ප්‍රතිකාර ලබන රෝගියෙකුගේ රැකවරණය සහ උපස්ථානය, රෝහලේ සේවය කරනු ලබන උපස්ථායකවරුන් විසින් ලබා දීමේ ක්‍රමවේදයක් රජය විසින් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 68/2025

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— ඉඩම් සඳහා බලපත්‍රලාභී ඔප්පු හිමියන්ට ස්ථිර ඔප්පු ලබා දීම,— රටේ ජනතාවගෙන් සැලකිය යුතු පිරිසකට ස්වකීය ඉඩම සඳහා හිමිව ඇත්තේ බලපත්‍ර හෝ ස්වර්ණ භූමි වැනි ඔප්පු වන හෙයින්, ඔවුන් සඳහා ඔප්පු ලබා දීමේ නිවැරදි ක්‍රමවේදයක් සැකසිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 70/2025

ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා,— යාපනයේ සංචාරක සේවා ප්‍රවර්ධනය කිරීම හා ආර්ථිකය සංවර්ධනය කිරීම, — ශ්‍රී ලංකාවේ යාපනය ප්‍රදේශයේ සංචාරක සේවා ප්‍රවර්ධනය කිරීම සහ ආර්ථිකය සංවර්ධනය කිරීම මඟින් මෙරට සංචාරක ආර්ථිකය ශක්තිමත් කිරීමටත්, රැකියා නිර්මාණය කිරීමටත්, යාපනය සජීවී සංස්කෘතික ගමනාන්තයක් ලෙස පිළිබිඹු කිරීමටත් හැකි වන බැවින්, යාපනය සහ ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශය ප්‍රධාන සංචාරක කේන්ද්‍ර ලෙස පිළිගැනීමට සහ දේශීය හා විදේශීය සංචාරකයින් ප්‍රදේශයේ හෝටල්, අවන්හල් සහ සේවා සපයන්නන් සමඟ සම්බන්ධ කිරීම, සැබෑ සංචාරක අත්දැකීම් ප්‍රවර්ධනය කිරීම, ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශයට සංචාරකයින් පැමිණීම සහ ඔවුන්ගේ තෘප්තිමත්භාවය ඉහළ නැංවීම සඳහා යටිතල පහසුකම්, ඩිජිටල් සම්බන්ධතාවය සහ අළෙවිකරණය වැඩි දියුණු කරන ප්‍රතිපත්ති සහ ආයෝජන සඳහා සහාය වන, ප්‍රදේශයේ සංචාරක කර්මාන්තයේ නියුතු වූවන් සවිබල ගන්වන සහ සංස්කෘතික උරුමය ප්‍රවර්ධනය කරන සංචාරක සේවා ව්‍යාපාර දිරිමත් කිරීම සහ ඒවාට පහසුකම් සැලසීම මඟින් යාපනය ප්‍රදේශයේ සංචාරක කර්මාන්තයේ තිරසාර සංවර්ධනය සහ ආර්ථික වර්ධනය වැඩිදියුණු කරන රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරීත්වයන් ප්‍රවර්ධනය කිරීම මඟින් සහ මාස 12 සිට 18 දක්වා වූ කාලයක් තුළ තිරසාර ආර්ථික ප්‍රතිලාභ ඉලක්ක කර ගනිමින් ප්‍රදේශයේ රැකියා සහ ව්‍යාපාරික අවස්ථා කෙරෙහි එවැනි වැඩසටහන් මඟින් ඇති කරන බලපෑම නිරීක්ෂණය කිරීම මඟින් යාපනය කේන්ද්‍ර කරගත් සංචාරක වේදිකාවක් නිර්මාණය කිරීම සඳහා සහාය දීමට පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 71/2025

ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා,— යාපනය හා උතුරු පළාත තුළ තරුණයන් සඳහා තිරසර රැකියා අවස්ථා නිර්මාණය කිරීම පිණිස ස්ථිර විශේෂ ආර්ථික කලාපයක් පිහිටුවීම,— ස්ථිර විශේෂ ආර්ථික කලාපයක් පිහිටුවීම මඟින් රජයට ආර්ථික වර්ධනය උත්තේජනය කොට දේශීය හා විදේශීය ආයෝජන ආකර්ෂණය කර ගනිමින් තරුණයින් සඳහා තිරසර රැකියා අවස්ථා ජනනය කළ හැකි හෙයින් ද, එවැනි කලාප සංවර්ධනය කිරීමෙන් රජයට කාර්මික ව්‍යාප්තිය ප්‍රවර්ධනය කිරීම, කුසලතා සංවර්ධනය වැඩි දියුණු කිරීම හා ව්‍යවසායකත්වය දිරිමත් කිරීම තුළින් විරැකියාවට විසඳුම් ලබාදිය හැකි හෙයින් ද, යාපනයේ උතුරු පළාතේ සහ සමස්තයක් වශයෙන් රටේ දිගුකාලීන සමාජ-ආර්ථික ප්‍රගතියක් ඇති කිරීමට රට පුරා අනෙකුත් උපායමාර්ගික ස්ථාන වලට සමගාමීව යාපනයේ සහ උතුරු පළාතේ ද ස්ථිර විශේෂ ආර්ථික කලාපයක් (SEZ) ස්ථාපිත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 72/2025

ගරු කන්දසාමි ප්‍රභු මහතා,— කිරි නිෂ්පාදන අංශයෙන් ස්වයංපෝෂිතත්වය ප්‍රවර්ධනය කිරීම,— වර්තමානයේ මෙරට සැලකිය යුතු විදේශ විනිමය අහිමි වීමකට මඟපාදමින් ආනයනික කිරි නිෂ්පාදන මත යැපෙන හෙයින්ද, උසස් ගව වර්ග, පශු වෛද්‍ය උපස්ථානය, සත්ව ආහාර හා යටිතල පහසුකම් සඳහා සීමිත ප්‍රවේශයක් තිබීම වැනි ගැටළුවලට ගොවීන් මුහුණපාන හෙයින්ද, මෙම අභියෝග ආමන්ත්‍රණය කිරීම මඟින් ආහාර සුරක්ෂිතතාව වර්ධනය කොට, ග්‍රාමීය රැකියා ජනනය කරමින්, ආනයන මත යැපීම අඩු කර ගත හැකි හෙයින්ද, අභිජනනය සහ පශු වෛද්‍ය සේවා වෙත ප්‍රවිශ්ටය දියුණු කිරීමෙන්, සත්ව ආහාර වගාව ව්‍යාප්ත කිරීමෙන්, ගොවි පුහුණුව හා යටිතල

පහසුකම් ශක්තිමත් කිරීමෙන්, කිරි ගොවීන්ට දිරිගැන්වීම් ලබා දීමෙන්, රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් ප්‍රවර්ධනය කිරීමෙන් සහ කිරිපට්ටි සංවර්ධනය පිළිබඳ පර්යේෂණ දිරිගැන්වීමෙන්, කිරිවලින් ස්වයංපෝෂිතභාවය සාක්ෂාත් කර ගනු පිණිස රජය විසින් ජාතික කිරිපට්ටි සංවර්ධන ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු බවටද, අදාළ අමාත්‍යාංශ විසින් පළාත් සභා හා ගොවි කණ්ඩායම් සමඟ සම්බන්ධීකරණය වීම සඳහා යාන්ත්‍රණයක් ඇති කරනු ලැබිය යුතු බවටද, අදාළ පාර්ලිමේන්තු කාරක සභාව විසින් වැඩිදුර ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සහ නිර්දේශ කිරීම නිරීක්ෂණය කරනු ලැබිය යුතු බවටද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 73/2025

ගරු රවී කරුණානායක මහතා,— ශ්‍රී ලාංකිකයන්ට සෞඛ්‍ය සම්පන්නභාවය සඳහා වඩා හොඳ අවස්ථා ලබා දීම,— ජනගහනයෙන් බහුතරයක් විවෘත හදවත් සැත්කම්වලට භාජනය වන හෙයින්, ශ්‍රී ලාංකිකයන්ට සෞඛ්‍ය සඳහා වඩා හොඳ අවස්ථා ලබා දිය යුතු බවටත්, ඒ සඳහා පෞද්ගලික අංශයේ සේවකයන්ට සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල හරහාද, රජයේ සේවකයින්ට සහ රැකියා නියුක්තිකයන් නොවන අයට රජය විසින් ජනාධිපති අරමුදල හරහාද පූර්ණ පිරිවැය සහිතව නොමිලේ පහසුකම් සලසා දිය යුතු බවටත් මෙම සභාව යෝජනා කර සිටී.

පා. 74/2025

ගරු චමින්ද විජේසිරි මහතා,— සතියේ වැඩ කරන දිනවල ප්‍රධාන නගර ආශ්‍රිතව උදෑසන කාලයේදී සහ සවස් කාලයේදී බස් ප්‍රමුඛතා මංතීරු කඩිනමින් ඇති කිරීම,— ප්‍රධාන නගර ආශ්‍රිතව උදෑසන හා සවස් කාලයේදී පවතින දැඩි මාර්ග තදබදයට පිළියමක් ලෙස උදෑසන සහ සවස් කාලයන්හිදී බස් ප්‍රමුඛතා මංතීරු ක්‍රමයක් ක්‍රියාවට නැංවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 75/2025

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— ඉතාලි-ශ්‍රී ලංකා ද්විපාර්ශ්වික රියදුරු බලපත්‍ර ගිවිසුම යාවත්කාලීන කිරීම,— ඉතාලි-ශ්‍රී ලංකා ද්විපාර්ශ්වික රියදුරු බලපත්‍ර ගිවිසුම මඟින් ශ්‍රී ලාංකිකයන්ට විශාල ප්‍රතිලාභ හිමිවන හෙයින්, එම ගිවිසුම නැවත යාවත්කාලීන කිරීමට පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 76/2025

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා,— සුහුරු විදුලිබල පද්ධතියක් සහ සුහුරු මීටර් හඳුන්වා දීම,— පුනර්ජනනීය බලශක්ති ප්‍රභේදයක් ලෙස සූර්ය බලශක්තිය ප්‍රවර්ධනය ඉතා වැදගත් වුවත්, විශේෂයෙන්ම වහල මත සවිකරන ලද සූර්ය පැනල මඟින් ජනනය වන විදුලි ප්‍රමාණය, පද්ධති පාලන මධ්‍යස්ථානයේදී වෙන්කර හඳුනාගත නොහැකි හෙයින්, ජාතික විදුලිබල පද්ධතිය (Grid) සුහුරු තත්ත්වයට (Smart Grid) පත්කිරීමටත්, සුහුරු මීටර් (Smart Meters) හඳුන්වා දීමටත් කටයුතු කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 77/2025

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා,— ආහාර රස ගැන්වීමට යොදන අහිතකර කෘත්‍රිම රසකාරක තහනම් කිරීම,— රයිස්, කොත්තු හා නූඩ්ල්ස් වැනි ආහාර රස ගැන්වීමට මෙරට ආපනශාලා සහ හෝටල්වලදී යොදන කෘත්‍රිම රසකාරක, නොයෙක් බෝ නොවන රෝගවලට හේතු වන බව වාර්තාවන හෙයින්, ඒ පිළිබඳව පිළිගත් ආයතනයක් මඟින් නිසි අධ්‍යයනයක් සිදුකර, එම අහිතකර රසකාරක තහනම් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 78/2025

ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා,— මඩකලපුව සිට පොතුවිල් දක්වා දුම්රිය මාර්ගය පුළුල් කිරීම හෝ මාතර සිට කල්මුණේ දක්වා දුම්රිය මාර්ගය පුළුල් කිරීම,— මඩකලපුව සිට පොතුවිල් දක්වා දුම්රිය මාර්ගය සහ මාතර සිට කල්මුණේ දක්වා දුම්රිය මාර්ගය පුළුල් කිරීම මඟින් මඩකලපුව, අම්පාර හා මොනරාගල යන දිස්ත්‍රික්කවල විශාල ජනතාවකට ප්‍රතිලාභ ලැබෙන හෙයින්, මඩකලපුව සිට පොතුවිල් දක්වා හෝ මාතර සිට කල්මුණේ දක්වා දුම්රිය මාර්ගය පුළුල් කිරීමට අවශ්‍ය පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 79/2025

ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය,— ජපන් ජබර ශාකයේ ව්‍යාප්තිය හිතකර ලෙස පාලනය හා මර්දනය කිරීම,— ජපන් ජබර නොහොත් Eichhornia crassipes (Mart.) Solms යන විද්‍යාත්මක නාමයෙන් හඳුන්වන ආක්‍රමණශීලී ශාකය, වර්තමානයේ ගොවි බිම් සහ වගුරු බිම් වසා පැතිරී ගොස් ඇති හෙයින් ද, මෙහි ශීඝ්‍ර වර්ධන වේගය හේතුවෙන් දේශීය ශාක අභිබවා ජෛව පරිසර පද්ධතියට තර්ජනයක් වී ඇති හෙයින් ද, මෙම තත්ත්වය හේතුවෙන් රොන් මඩ තැන්පත් වී ජල ප්‍රවාහන මාර්ග සහ ජල බැස්ම අවහිර වීම මඟින් ජල ගැලීම් හා ගංවතුර තත්ත්ව ඇති වී ඇති හෙයින් ද, එදිනෙදා භාවිතයට අවශ්‍ය වන ජලයේ තත්ත්වයට හානිවීම සහ ජල විදුලි උත්පාදනයේදී බාධා ඇති වී ඇති හෙයින් ද, රසායනික වල් නාශක භාවිතය මඟින් ඒවා මර්දනය එම ජලය පරිහරණය කරන පුද්ගලයින්ට සෞඛ්‍ය අවදානමක් ඇති කරන හෙයින් ද, මදුරු කීටයන් බෝවීම හා එමඟින් බරවා හා ඩෙංගු වැනි රෝග ව්‍යාප්තවීම සිදු වී ඇති හෙයින් ද, මෙම ශාකය හිතකර ලෙස පාලනය හා මර්දනය මඟින් තිරසර විසඳුමක් උදෙසා රජය විසින් අදාළ ව්‍යාපෘති යෝජනා සැකසීම කාලෝචිත බව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 80/2025

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— කොරෝනා වසංගතය පැවති කාලය තුළ, ඒකපාර්ශ්විකව හා බලහත්කාරයෙන් මුස්ලිම් ජනතාවගේ මෘතදේහ ආදාහනය කිරීම සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා කොමිෂන් සභාවක් පිහිටුවීම,— කොරෝනා වසංගතය පැවති කාලය තුළ, ලෝක සෞඛ්‍ය සංවිධානයේ මාර්ගෝපදේශයන්ට පටහැනිව ඒකපාර්ශ්විකව හා බලහත්කාරයෙන් ආදාහනය කරන ලද මුස්ලිම් ජනතාවගේ මෘතදේහ සංඛ්‍යාව, එලෙස ආදාහනය කරන ලද පුද්ගලයින්ගේ නම් හා ලිපිනයන් යනාදී තොරතුරු විමර්ශනය කිරීම සඳහාත්, මෙසේ මෘතදේහ බලහත්කාරයෙන් ආදාහනය කිරීමට හේතු වූ පසුබිම මෙන්ම බලහත්කාරයෙන් ආදාහනය කරන ලද පුද්ගලයින්ගේ ඥාතීන්ගේ මානසික

තත්ත්වය පිළිබඳව විමර්ශනය කිරීම සඳහාත්, මෙයට අනුබල දෙමින් මාර්ගෝපදේශයන්ට පටහැනිව කටයුතු කළ දේශපාලනඥයන් ඇතුළු රජයේ නිලධාරින් සම්බන්ධයෙන් ගත යුතු පියවර පිළිබඳව විමර්ශනය කිරීම සඳහාත්, කොමිෂන් සභාවක් පිහිටුවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 81/2025

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— රසායන ද්‍රව්‍ය යොදා පලතුරු ඉදවීම නතර කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ පලතුරු වෙළඳපොළ තුළ ස්වාභාවිකව පැසී ඉදුණු පලතුරු වෙනුවට, නොපැසුණු පලතුරු රසායන ද්‍රව්‍ය යොදා කෘත්‍රිමව ඉදීමට සලස්වා අලෙවි කරනු ලබන හෙයින් ද, ආනයනික පලතුරු ද රසායන ද්‍රව්‍ය යොදා කෘත්‍රිමව ඉදීමට සලස්වා අලෙවි කරනු ලබන හෙයින් ද, මෙම පලතුරු වැඩි වශයෙන් දරුවන් විසින් ආහාරයට ගනු ලබන හෙයින් ද, කූට ව්‍යාපාරිකයින් රටේ අනාගතය විනාශ කරමින් ලාභ ලැබීමේ පරමාර්ථයෙන් සිදු කරන මෙම ක්‍රියාව නතර කිරීමට විධිමත් ක්‍රමවේදයක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 82/2025

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— ආයතන ප්‍රධානීන් පත්කිරීමේ නිර්ණායකයක් ලෙස ප්‍රධාන කාර්ය සාධන දර්ශකය යොදා ගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම,— රජයේ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන් පත්කිරීමේ දී ජ්‍යෙෂ්ඨත්වය සේම ඔවුන්ගේ ප්‍රධාන කාර්ය සාධන දර්ශකය (KPl - Key Performance Indicator) නිර්ණායකයක් ලෙස යොදා ගැනීම සඳහා ක්‍රමවේදයක් රාජ්‍ය සේවයට ඇතුළත් කොට, ඒ අනුව ආයතන ප්‍රධානීන් පත්කිරීමට නිර්දේශ ලබා ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 83/2025

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ අමාත්‍යවරුන් හට තනතුරු ලබා දීමේ දී ප්‍රධාන කාර්ය සාධන දර්ශකය සලකා බැලීම, — පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සහ අමාත්‍යවරුන්ගේ ප්‍රධාන කාර්ය සාධන දර්ශකය (KPI - Key Performance Indicator) වාර්ෂිකව පරීක්ෂා කර, ඔවුන්ට තනතුරු ලබා දීමේ දී එකී දර්ශකය සලකා බලා, තනතුරු ලබාදීමේ ක්‍රමවේදයක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 84/2025

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— අග්‍ර විනිශ්චයකාරවරයාගේ සිට අධිකරණ ක්ෂේත්‍රයේ පහළ නිලයන් දක්වා තනතුරු දැරූ තැනැත්තන් වෙනත් තනතුරුවලට පත්කිරීමේ දී ඔවුන්ගේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම, — අග්‍ර විනිශ්චයකාරවරයාගේ සිට අධිකරණ ක්ෂේත්‍රයේ පහළ නිලයන් දක්වා තනතුරු දැරූ තැනැත්තන්, ඔවුන්ගේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම වෙනුවෙන්, එකී තනතුරු දැරීම නතර වූ තැන් සිට අවම වශයෙන් වසර තුනක කාලයක් රාජ්‍ය සේවයේ, සංස්ථාපිත මණ්ඩල, කොමිෂන් සභා, විනිශ්චය මණ්ඩලවල හෝ විදේශ සේවයේ (තානාපති වැනි) තනතුරුවලට පත් නොකළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 86/2025

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— දේශපාලන පක්ෂ විසින් මහජන නියෝජිතයින්ගේ වැටුප්, දීමනා සහ වාහන බලපත්‍ර ආදිය තම පක්ෂවල අරමුදල් සඳහා බැර කර ගැනීම නතර කිරීම,— දේශපාලන පක්ෂ විසින් තම පක්ෂයෙන් තේරී පත් වූ මහජන නියෝජිතයින්ගේ මාසික වැටුප්, දීමනා සහ වාහන බලපත්‍ර ආදිය එම පක්ෂවලට ලබා ගැනීම මහජන නියෝජිතයින්ගේ ස්වාධීනත්වය අහෝසි වන ක්‍රියාවක් වන හෙයින් ද, එය ප්‍රජාතන්ත්‍රවාදයට බරපතල අභියෝගයක් වන හෙයින් ද, මෙලෙස දේශපාලන පක්ෂ විසින් මහජන නියෝජිතයින්ගේ වැටුප්, දීමනා සහ වාහන බලපත්‍ර ආදිය තම පක්ෂවල අරමුදල් සඳහා බැර කර ගැනීම නොකළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 87/2025

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— සෑම දිස්ත්‍රික්කයකම මත් ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීමේ මධ්‍යස්ථානයක් පිහිටුවීම,— මේ වනවිට හෙරොයින් වැනි මත් ද්‍රව්‍ය භාවිතා කරන්නන්ගේ ශීඝ්‍ර වර්ධනයක් දක්නට ලැබෙන හෙයින් ද, ඒ සඳහා ඇබ්බැහිවූවන් ප්‍රදේශයකට සීමා නොවී රට පුරා ව්‍යාප්තව සිටීම සහ ඔවුන්ගෙන් ප්‍රචාරණය වීම මෙයට හේතු වී තිබෙන හෙයින් ද, මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීමේ මධ්‍යස්ථාන රට පුරා ස්ථාන කිහිපයක පමණක් පැවතීම මත් ද්‍රව්‍ය භාවිතා කරන්නන්ගේ වර්ධනය පාලනය කිරීමට දැඩි ගැටලුවක්ව ඇති හෙයින් ද, එයට විසඳුමක් ලෙස සියලු පහසුකම් සහිතව අවම වශයෙන් දිස්ත්‍රික්කයකට එක් පුනරුත්ථාපන මධ්‍යස්ථානයක් ඇති කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 88/2025

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා,— ශ්‍රී ලංකාවේ වන සතුන් කළමනාකරණය කිරීම සඳහා ජාතික ප්‍රතිපත්තියක් සහ ක්‍රමවේදයක් සකස් කිරීම,— ශ්‍රී ලංකාව ජාත්‍යන්තර වශයෙන් ජෛව විවිධත්වයෙන් ඉහළ රටක් ලෙස සැලකෙන හෙයින් ද, වනාන්තර විනාශය, මිනිසුන්ගේ ආක්‍රමණය හේතුවෙන්, නීති විරෝධී වන සතුන් වෙළඳාම, මිනිසා සහ වන සතුන් අතර ගැටුම් වර්ධනය වීම නිසා වාර්ෂිකව මෙම සතුන් මෙන්ම මිනිස් ජීවිත ද විශාල වශයෙන් අහිමි වන හෙයින් ද, නව ප්‍රතිපත්ති සහ සැලසුම් මඟින් ජාතික වන සතුන් කළමනාකරණ ප්‍රතිපත්තියක් සකස් කිරීම තිරසර සංවර්ධන අරමුණක් වන හෙයින් ද, එමඟින් සතුන්ගේ වාසස්ථාන ආරක්ෂා වීම, මිනිසා සහ වන සතුන් අතර ගැටුම් අවම වීම, ගොවි ජනතාවගේ ආර්ථික මට්ටම සහ සමාජ ජීවිතය උසස් වීම සිදුවන හෙයින් ද, ඒ සඳහා ක්‍රියාත්මක කළ හැකි ප්‍රායෝගික හා නවීන ප්‍රතිපත්තියක් සහ ක්‍රමවේදයක් සකස් කර ක්‍රියාත්මක කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 89/2025

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා,— ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ඉඩම් වඩාත් ඵලදායි ලෙස භාවිතා කිරීම,— ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රය රටේ ආර්ථිකයේ මූලික අංශයක් වන හෙයින් ද, වාර්ෂිකව නිෂ්පාදන ක්‍රියාවලියට යොදවනුයේ කෘෂිකාර්මික ඉඩම්වලින් 40%කට ආසන්න ප්‍රමාණයක් පමණක් වන හෙයින් ද, ඉතිරි ඉඩම් නිසි ලෙස සැලසුම් නොකිරීම, ජල සම්පත් හිඟය, තාක්ෂණික දැනුම නොමැති වීම සහ නව්‍යකරණය

නොවීම හේතුවෙන් භාවිතා නොවන හෙයින් ද, නිෂ්පාදන මට්ටම අඩු වීම මඟින් ආහාර ආනයනය සඳහා වසරකට විශාල මුදලක් වැය වන හෙයින් ද, කෘෂිකාර්මික නිෂ්පාදනයේ වර්ධනය ඉදිරි වසර කිහිපය තුළ 30%කින් වැඩි කිරීමටත්, ඉන් ගොවීන්ගේ ආදායම වැඩි කිරීමටත්, වාණිජ කෘෂිකර්මයේ ව්‍යාප්තිය වැඩි කිරීමටත්, සියලුම කෘෂිකාර්මික භූමි ගවේශණය කර, භූමියෙහි වර්ගය, බෝගවලට යෝග්‍ය බව, ජලය සහ ගොවිතැන පිළිබඳ තොරතුරු ඇතුළත් මූලික දත්ත පද්ධතියක් සකස් කිරීම මඟින් රටේ ආහාර සුරක්ෂිතතාව ඇති කිරීමටත්, ගොවීන්ගේ ජීවන මට්ටම උසස් කිරීමටත්, ඉඩම් වඩාත් ඵලදායි ලෙස භාවිතා කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 90/2025

ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා,— යාපනය දිස්ත්‍රික්කයේ අක්වෙරළ දූපත්වල පදිංචිකරුවන් සඳහා මුහුදු ප්‍රවාහන පහසුකම් වැඩිදියුණු කිරීම,— යාපනය දිස්ත්‍රික්කයේ විශේෂයෙන් නෙඩුන්තීව්, නයිනතීව්, එලුවයිතීව් සහ අනලයිතීව් වැනි අක්වෙරළ දූපත්වල පදිංචිකරුවන්ට දශක ගණනාවක් තිස්සේ ප්‍රමාණවත් මුහුදු ප්‍රවාහන පහසුකම් අහිමි වී ඇති හෙයින් ද, එහි ප්‍රතිඵලයක් ලෙස, ඔවුන්ට මුහුදු මාර්ගයෙන් පැය කිහිපයක් ගමන් කිරීමට සිදු වන හෙයින් ද, රෝගීන්, ගර්භනී කාන්තාවන්, වැඩිහිටියන්, පාසල් කාර්ය මණ්ඩලය සහ රාජ්‍ය නොවන සංවිධානවල සේවකයින් මෙම ගමන්වලදී දැඩි දුෂ්කරතා සහ අවදානම්වලට මුහුණ දෙන හෙයින් ද, ''ගම් සංවර්ධනය ජාතියේ සංවර්ධනය'' බව පිළිගෙන ඇති හෙයින් ද, එම දූපත්වල පදිංචිකරුවන්ට නවීන, ආරක්ෂිත, වේගවත් සහ විශ්වාසදායක මුහුදු ප්‍රවාහන පහසුකම් සැපයීමට රජය වහාම පියවර ගත යුතු බව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 91/2025

ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා,— තලෛයිමන්නාරම-රාමේෂ්වරම් බෝට්ටු සේවාව ආරම්භ කිරීම,— තලෛයිමන්නාරම-රාමේෂ්වරම් බෝට්ටු සේවය ආරම්භ කිරීම මඟින් විශේෂයෙන්ම ඉන්දියාවේ සිට මෙරටට සංචාරකයින් පැමිණීම වැඩි කරනු ලැබිය හැකි හෙයින් ද, එමඟින් මහජනතාවට අඩු වියදමකින් තමිල්නාඩුවට ගමන් කර පවතින නීති හා රෙගුලාසිවලට යටත්ව දැරිය හැකි මිලකට අත්‍යවශ්‍ය භාණ්ඩ මිල දී ගැනීමට හැකියාව ලබා දී ඔවුන්ගේ ජීවනෝපායන් වැඩිදියුණු කළ හැකි හෙයින් ද තලෛයිමන්නාරම-රාමේෂ්වරම් බෝට්ටු සේවාව ආරම්භ කිරීම සඳහා රජය වහාම පියවර ගත යුතු බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 93/2025

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— සංවර්ධනයේ කලාපීය විෂමතා අවම කිරීම සඳහා වෙන් වූ විශේෂ සංවර්ධන අරමුදලක් පිහිටුවීම,— පසුගිය දශක කිහිපය තුළ දිග්ගැස්සුනු සිවිල් අරගල සහ ඓතිහාසිකව සිදුවුණු නොසලකා හැරීමෙන් ඇති වූ බලපෑම් හේතුවෙන් උතුරු පළාත, නැගෙනහිර පළාත, මොනරාගල දිස්ත්‍රික්කය සහ නුවරඑළිය දිස්ත්‍රික්කය වැනි පසුගාමී කලාප දැඩි ආර්ථික දුෂ්කරතාවන්ට මුහුණ දෙමින් සිටින හෙයින්ද; වර්තමාන ආර්ථික අර්බුදය තුළින් මෙම පසුගාමී කලාපවල ජනතාවගේ ජීවනෝපායන් මත අසමානුපාතික බරක් පටවමින් මෙම විෂමතා තවදුරටත් උග්‍ර කර ඇති හෙයින්ද; ආර්ථික වශයෙන් අසාධාරණයට ලක් වූ ප්‍රදේශවල සාධාරණ වර්ධනය, තිරසාර සංවර්ධනය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය බලගැන්වීම ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් මෙම

ගැටලු විසඳීම සඳහා වෙන් වූ ජාතික වැඩසටහනක් ස්ථාපිත කිරීම අවශ්‍ය වන හෙයින්ද; වසර 10+2 වැඩසටහන් කාලපරිච්ඡේදයක් තුළ ඇමරිකානු ඩොලර් මිලියන 250 ක ඉලක්කගත ප්‍රමාණයකින් රජයේ, ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික හවුල්කරුවන්, පෞද්ගලික ආයෝජකයින් සහ පරිත්‍යාගශීලී දානපතියන්ගෙන් දායක මුදල් රැස් කිරීම වෙනුවෙන් එම පසුගාමී කලාප සඳහා ජාතික සංවර්ධන අරමුදලක් ස්ථාපිත කිරීමටත්; කෘෂිකර්මාන්තය, ධීවර හා ගෘහ කර්මාන්ත හරහා ග්‍රාමීය ජීවනෝපායන් නඟාසිටුවීම, සේවා නියුක්තිය සහ කාන්තාවන් සමාජීය හා ආර්ථිකමය වශයෙන් සවිබල ගැන්වීම ප්‍රවර්ධනය කිරීම සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, අක්‍රිය වත්කම් සක්‍රීය කිරීම සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ සමුපකාර සඳහා සහාය වීම, පුනර්ජනනීය බලශක්තිය සහ අනෙකුත් වාණිජමය වශයෙන් ශක්‍ය ව්‍යාපාර සඳහා ආයෝජනය කිරීම, ධාරිතා වර්ධනය සහ කාන්තාවන් සහ තරුණයින් දැනුවත් කිරීම ආරම්භ කිරීම සඳහා අරමුදල් උපායමාර්ගිකව යෙදවීමටත්; දේශීය ධාරිතාව ගොඩනැඟීම සඳහා ආයෝජනවල ශක්‍යතාවන්හි අඩුපාඩු නැවැත්වීම සහ අරමුදල් ඵලදායී හා විනිවිදභාවයෙන් යුක්තව භාවිතා කිරීම සහතික කිරීම සඳහා තාක්ෂණික සහාය පහසුකමක් (TAF) ස්ථාපිත කිරීමට පහසුකම් සැලසීමටත්; ආර්ථික ක්‍රියාකාරකම් සහ තීරණ ගැනීමේදී කාන්තා සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා මැනිය හැකි ඉලක්ක සහිතව, සියලුම ආයෝජන ක්ෂේත්‍ර හරහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය ඇතුළත් කිරීම සහතික කිරීමටත්; ශ්‍රී ලංකාවේ සියල්ල ඇතුළත් වන වර්ධනය, සංහිඳියාව සහ තිරසාර සංවර්ධනය සඳහා හදිසි ජාතික පියවරක් ලෙස අරමුදල පිහිටුවීම සලකා බැලීමෙන්, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී සාධාරණ කලාපීය ආවරණය, වගවීම සහ තිරසාරභාවය සහතික කිරීම සඳහා අරමුදල සමඟ සම්බන්ධීකරණය කිරීමට අදාළ අමාත්‍යාංශ, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවලට බලය පැවරීමටත් ශ්‍රී ලංකා රජය පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 94/2025

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— කඩොලාන පරිසර පද්ධතිය ආරක්ෂා කර ගැනීමට වැඩසටහනක් සකස් කිරීම,— පරිසර සමතුලිතතාවයට හා ධීවර කර්මාන්තයට අතිශය වැදගත් වන කඩොලාන පරිසර පද්ධතිය ආරක්ෂා කර ගැනීම සඳහා වැඩසටහනක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 95/2025

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— පෞද්ගලික බස්රථ සඳහා බලපත්‍ර ලබාදීමේ ක්‍රමවේදය විධිමත් කිරීම,— පළාත්බද මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය මඟින් සිදුකරන පෞද්ගලික බස්රථ සඳහා බලපත්‍ර ලබාදීමේ ක්‍රියාවලිය අතිශයින් දූෂිත තත්ත්වයට පත්වී තිබෙන බැවින්, එම තත්ත්වය වැළැක්වීම සඳහා සුදුසු වැඩසටහනක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 97/2025

ගරු අජිත් පී. පෙරේරා මහතා,— ශ්‍රී ලංකාවේ දරු උපත් සංඛ්‍යාව ඉහළ දැමීම සඳහා පවුල් ඒකකයන් වෙත දිරි දීමනාවක් ලබා දීම,— 2018 වසරේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ වාර්ෂික දරු උපත් සංඛ්‍යාව අඛණ්ඩව පහත යමින් තිබෙන බව නිරීක්ෂණය වී ඇති හෙයින් ද, එහි ප්‍රතිඵලයක් ලෙස අනාගතයේ ශ්‍රී ලංකාවේ තරුණ ජනගහනය පහළ යාම නියත වශයෙන් සිදුවන හෙයින් ද, තරුණ ජනගහනය පහළ යාම ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධන

ක්‍රියාදාමයට ඉතා අගතිදායක ලෙස බලපාන හෙයින් ද, ශ්‍රී ලංකාවේ දරු උපත් සංඛ්‍යාව ඉහළ දැමීම සඳහා පවුල් ඒකක වෙත ආකර්ශණීය දිරි දීමනාවක් ලබා දීමට රජය විසින් පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 98/2025

ගරු අජිත් පී. පෙරේරා මහතා,— 'සූර්ය බල සංග්‍රාමය' ව්‍යාපෘතිය ප්‍රවර්ධනය කිරීම,— ශ්‍රී ලංකාවේ බලශක්ති මූලාශ්‍රයන් අතරින් සූර්ය විදුලි බලය ලාබදායි සහ පරිසර හිතකාමී මූලාශ්‍රයක් ලෙස හඳුනාගෙන ඇති හෙයින් ද, 2016.09.06 දින ආරම්භ කරන ලද 'සූර්ය බල සංග්‍රාමය' (Battle for Solar Energy) ව්‍යාපෘතිය මඟින් දැනටමත් ජාතික විදුලි පද්ධතියට සූර්ය විදුලි බලය 2000 MWට වැඩි ප්‍රමාණයක් එක් කර ඇති හෙයින් ද, විදුලි ඒකකයක මිල අඩු කිරීමේ ක්‍රමවේදයක් සහ පරිසරය ආරක්ෂා කිරීමේ උපාය මාර්ගයක් ලෙස, 'සූර්ය බල සංග්‍රාමය' ව්‍යාපෘතිය තවදුරටත් ප්‍රවර්ධනය කොට ආරක්ෂා කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 99/2025

ගරු අජිත් පී. පෙරේරා මහතා,— 'කළුතර මුහුදු වෙරළ කලාපය' විශේෂිත ආර්ථික කලාපයක් ලෙස ප්‍රවර්ධනය කිරීම,— කළුතර නගරය මුල් කරගත් සංචාරක කලාපයක් සංවර්ධනය කිරීම වෙනුවෙන් ද, කළු ගඟේ මෝය සහ මුහුදු වෙරළ ආරක්ෂා කිරීමේ උපාය මාර්ගයක් ලෙස ද, කැලිඩෝ මුහුදු වෙරළ සහ කළු ගඟේ මෝය වෙනස් වීම හේතුවෙන් අලුතින් බිහිවී ඇති ගොඩබිම ඇතුළත්, 'කළුතර මුහුදු වෙරළ කලාපය', විශේෂිත ආර්ථික කලාපයක් ලෙස ප්‍රවර්ධනය කොට සංවර්ධනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 100/2025

ගරු අජිත් පී. පෙරේරා මහතා,— 'මිල්ලනිය අපනයන සැකසුම් කලාපය' ඉදිකිරීම කඩිනම් කිරීම,— කළුතර දිස්ත්‍රික්කයේ, 'මිල්ලනිය අපනයන සැකසුම් කලාපය' (Millaniya Export Processing Zone) සඳහා අවශ්‍ය ඉඩම් අක්කර 240ක් දැනටමත් පවරා ගෙන ඇති හෙයින් ද, එම ව්‍යාපෘතිය සඳහා අධිවේගී මාර්ග පිවිසුම්, නළ ජලය සහ විදුලිය ලබා දීම සඳහා රජය විසින් රුපියල් බිලියනයකට ආසන්න මුදලක් දැනටමත් වැයකර ඇති හෙයින් ද, එම අපනයන සැකසුම් කලාපය සඳහා තෝරාගත් භූමිය එවැනි ව්‍යාපෘතියක් සඳහා සුදුසු බවට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් දැනටමත් හඳුනාගෙන ඇති හෙයින් ද, එම අපනයන සැකසුම් කලාපය ඉදිකිරීම රජයේ ප්‍රමුඛ ව්‍යාපෘතියක් ලෙස සලකා අවශ්‍ය ඉදිරි පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 101/2025

ගරු අජිත් පී. පෙරේරා මහතා,— ඉංග්‍රීසි භාෂාවෙන් ද්විතියික අධ්‍යාපනය ලබාදීම ප්‍රවර්ධනය කිරීම,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18(3) ව්‍යවස්ථාව ප්‍රකාරව 'ඉංග්‍රීසි භාෂාව' ශ්‍රී ලංකාවේ සන්ධාන භාෂාව (Link Language) ලෙස පිළිගෙන ඇති හෙයින් ද, ජාත්‍යන්තර භාෂාවක් වන 'ඉංග්‍රීසි භාෂාව' පුරවැසියන්ට දැනුම ලබා ගැනීමේ ප්‍රධාන උපාය මාර්ගයක් ලෙස හඳුනාගෙන ඇති හෙයින් ද, ශ්‍රී ලංකාවේ සියලු පුරවැසියන්ට භාෂා හෝ ජාති භේදයක් නොමැතිව එකම රටක ජීවත් වීම සඳහා අවශ්‍ය වන සන්ධාන භාෂාව ලෙස ඉංග්‍රීසි භාෂාවේ ප්‍රවීණතාවය ලබා ගැනීම ඉතා වැදගත් වන හෙයින් ද, නිදහස් අධ්‍යාපන සංකල්පය තුළ බිහි

වූ ශ්‍රී ලංකාවේ මධ්‍ය මහා විද්‍යාල පද්ධතිය තුළ සහ තවත් පාසැල් ගණනාවක ඉංග්‍රීසි භාෂාවෙන් ද්විතීයික අධ්‍යාපනය ලබාදීමේ ක්‍රමවේදය සාර්ථක වී ඇති හෙයින් ද, ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට ජාත්‍යන්තර රැකියා අවස්ථාවන් ලබා ගැනීම උදෙසා ඉංග්‍රීසි භාෂාවෙන් ලැබෙන අධ්‍යාපනය අතිශය වැදගත් වන හෙයින් ද, ශ්‍රී ලංකාවේ සියලුම ද්විතියික පාසැල් වල (Secondary Schools) ඉංග්‍රීසි මාධ්‍යයෙන් (English Medium) අධ්‍යාපනය ලබා දිය යුතු යැයි ද, ඒ සඳහා ප්‍රමාණවත් ආයෝජනයක් සිදු කිරීම සඳහා රජය ප්‍රමුඛතාවය ලබා දිය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 102/2025

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා,— ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය සඳහා ඉංජිනේරු පීඨයක් ස්ථාපනය කිරීම,— ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය දේශීය හා විදේශීය රැකියා වෙළඳපොළ තුළ අවශ්‍යතා සපුරාලන නවීන තාක්ෂණික උපාධිධාරින් පිරිසක් සපයන විශ්වවිද්‍යාලයක් වන හෙයින්, ශ්‍රී ලංකාවේ වර්ධනය වන ඉදිකිරීම්, කාර්මික, කර්මාන්ත සහ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රවල මෙන්ම ගෝලීය අවශ්‍යතාවන් ද සලකමින්, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය සඳහා ඉංජිනේරු පීඨයක් ස්ථාපනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 103/2025

ගරු රෝහණ බංඩාර මහතා,— පිහිනුම් කුසලතාවය ඉහළ දැමීමේ වැඩසටහනක් සකස් කිරීම,— දියෙහි ගිලී මිය යන පුද්ගලයන්ගේ සංඛ්‍යාව දිනෙන් දින ඉහළ යන බව මෑත කාලීනව නිරීක්ෂණය වන හෙයින්, ඉතා උසස් වාරි ශිෂ්ඨාචාරයකට හිමිකම් කියන අතීත ජනතාව තුළ පැවති පිහිනුම් කුසලතාවය, වත්මන් පරපුර තුළ ද ප්‍රවර්ධනය කිරීම සඳහා වැඩසටහනක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 106/2026

ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා,— ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය සඳහා වෛද්‍ය පීඨයක් ස්ථාපනය කිරීම,— ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය දේශීය හා විදේශීය රැකියා වෙළෙඳපොළ අවශ්‍යතා සපුරාලන නවීන තාක්ෂණික උපාධිධාරින් පිරිසක් සපයන විශ්වවිද්‍යාලයක් වන හෙයින්, ශ්‍රී ලංකාවේ වෛද්‍ය ක්ෂේත්‍රවල වර්ධනය වන අවශ්‍යතාවන් මෙන්ම ගෝලීය අවශ්‍යතාවන් සලකමින්, ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය සඳහා වෛද්‍ය පීඨයක් ස්ථාපනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.108/2026

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— දියගම වනාන්තරය ආරක්ෂා කිරීම,— දියගම වනාන්තරය කොළඹ තදාසන්නයේ ඉතිරිව ඇති අවසාන නාගරික පහත්බිම් වැසි වනාන්තරවලින් එකක් වන අතර නගරයට ආසන්නතම වැසි වනාන්තර කොටස වන හෙයින් ද; බොල්ගොඩ ගඟ පෝෂණය කරන එහි තෙත්බිම් සහ ඇළ දොළ හරහා ජල ප්‍රවාහය නියාමනය කිරීමෙන් ස්වාභාවික ගංවතුර අවරෝධකයක් ලෙස එය වැදගත් කාර්යභාරයක් ඉටු කරන හෙයින් ද, එමඟින් අවට ප්‍රජාවන් ගංවතුරෙන් ආරක්ෂා කෙරෙන හෙයින් ද; මෙම වනාන්තරය රතු උණහපුළුවා, දම් පැහැ මුහුණැති කොළ වඳුරා සහ හඳුන් දිවියා වැනි වඳවීමේ තර්ජනයට ලක්ව ඇති සත්ත්ව විශේෂ ඇතුළුව ශාක හා සත්ත්ව විශේෂ 220 කට අධික සංඛ්‍යාවකට නිවහන වන හෙයින් ද; ආසන්න වශයෙන් 12.6% ක් ආවේණික ශාක හා

11.58% ක් ආවේණික සත්ත්ව විශේෂ සඳහා රැකවරණය සලසන එකම තීරණාත්මක ජෛව විවිධත්ව කේන්ද්‍රස්ථානයක් වන හෙයින් ද, ඒවායිනුත් බොහොමයක් නාගරික ව්‍යාප්තිය නිසා වැඩි වැඩියෙන් තර්ජනයට ලක්ව ඇති හෙයින් ද; දියගම වනාන්තරය එහි උණහපුළු ගහනය සම්බන්ධයෙන් ජාත්‍යන්තරව පිළිගැනීමට ලක්ව ඇති හෙයින් ද, විදේශීය සංචාරකයින් ආකර්ෂණය කර ගනිමින් තිරසර පාරිසරික සංචාරක ව්‍යාපාරය සඳහා ශක්තිමත් විභවයක් පවතින හෙයින් ද; ජෛව විවිධත්වය, දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව සහ ප්‍රජා ආරක්ෂාව තහවුරු කිරීම සඳහා මෙම වනාන්තරයේ ආරක්ෂාව අත්‍යවශ්‍ය වන හෙයින් ද; දියගම වනාන්තරය අහිමි වීම නැවත යථා තත්ත්වයට පත් කළ නොහැකි තත්ත්වයක් වනු ඇති හෙයින් ද, එය අප්‍රමාදව සංරක්ෂණය කිරීම අනාගත පරම්පරාවන් සඳහා අත්‍යවශ්‍ය කටයුත්තක් වන බැවින් සහ ශ්‍රී ලංකාව එකඟ වී ඇති ජාතික හා ජාත්‍යන්තර සංරක්ෂණ එකඟතාවන් සම්පූර්ණ කිරීමක් වන හෙයින් ද; දියගම වනාන්තරය තුළ සිදු කෙරෙන සියලුම එළිපෙහෙළි කිරීම් සහ සංවර්ධන කටයුතු වහාම නතර කිරීමට, වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක පනත (FFPA) යටතේ ආරක්ෂිත ප්‍රදේශයක් ලෙස එය ගැසට් කිරීමට, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ බලසීමාව යටතේ එය තැබීමට සහ අනාගත ආක්‍රමණ සහ තිරසර නොවන සංවර්ධනයට එරෙහිව හැකි තරම් ශක්තිමත් නීතිමය ආරක්ෂාව සහතික කිරීමට කඩිනමින් ක්‍රියා කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 109/2026

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— සත්‍ය සෙවීමේ කොමිෂන් සභාවක් ස්ථාපනය කිරීම,— වසර 26 කට වැඩි කාලයක් පුරා පැවැති උතුරු නැගෙනහිර යුද්ධය නිසා සිදු වූ ජීවිත හානි, අතුරුදහන්වීම් සහ අනෙකුත් විනාශයන් සොයා බැලීම සඳහා ද, ජාතික සමඟිය ඇති කිරීම සහ ඒ වෙනුවෙන් ගත හැකි ඉදිරි පියවර සොයා බැලීම සඳහා ද වන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා සත්‍ය සෙවීමේ කොමිෂන් සභාවක් (Truth Commission) ස්ථාපිත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 110/2026

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— වයස අවුරුදු 15ට අඩු ළමුන්ට සමාජ මාධ්‍ය භාවිතය සීමා කරන නීතිමය ක්‍රමවේදයක් හඳුන්වාදීම,— අධික සමාජ මාධ්‍ය භාවිතය හේතුවෙන් ළමුන් අතර මානසික පීඩනය සහ ආතතිය වැඩිවීම, අධ්‍යාපන කාර්ය සාධනය පහළ යාම, සයිබර් හිංසන (cyberbullying), අශෝභන හා අනාරක්ෂිත අන්තර්ගතයන්ට නිරාවරණය වීම වැනි ගැටලු වැඩිවෙමින් පවතින හෙයින් ද, ඕස්ට්‍රේලියාව, ප්‍රංශය හා ඩෙන්මාර්ක් වැනි දියුණු රටවල් මේ වනවිටත් ළමුන් සඳහා සමාජ මාධ්‍ය භාවිතය සීමා කිරීමට නීති හඳුන්වා දී තිබෙන හෙයින් ද, ළමුන්ගේ මානසික සෞඛ්‍යය, ආරක්ෂාව සහ අධ්‍යාපනමය වර්ධනය ආරක්ෂා කිරීම වෙනුවෙන් සමාජ මාධ්‍ය ගිණුම් විවෘත කිරීම සඳහා අවම වයස අවුරුදු 15 ලෙස නියම කිරීම, සමාජ මාධ්‍ය සමාගම් සඳහා වයස් සත්‍යාපන ක්‍රම අනිවාර්ය කිරීම, නීතිය උල්ලංඝනය කරන ආයතන සඳහා දඩ සහ නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සහ වැඩිහිටියන්ගේ ගිණුම් භාවිතා කරමින් සමාජ මාධ්‍ය භාවිතා කරන දරුවන් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගැනීම යන කරුණු ක්‍රියාවට නැංවීම සඳහා වයස අවුරුදු 15ට අඩු ළමුන්ට සමාජ මාධ්‍ය භාවිතය සීමා කරන නීතිමය ක්‍රමවේදයක් හඳුන්වාදීමට පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

**2026 අප්‍රේල් 21** අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

209/2024

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බෝයර් (Boer) වර්ගයේ එළුවන් 250ක් අභිජනනය කර ක්ෂේත්‍රගත කිරීමේ පස් අවුරුදු ව්‍යාපෘතිය, මාතලේ, ඉඹුල්දණ්ඩ එළු අභිජනන මධ්‍යස්ථානයේදී ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) එම ව්‍යාපෘතිය සඳහා මේ වනවිට වැය කර ඇති මුදල කොපමණද;

(iii) එම ව්‍යාපෘතිය යටතේ වාර්ෂිකව අභිජනනය කිරීමට අපේක්ෂා කරන ලද එළුවන් සංඛ්‍යාව සහ සත්‍ය වශයෙන්ම අභිජනනය කරන ලද එළුවන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම ව්‍යාපෘතියේ ආදායම සහ වියදම අනුව එක් එළුවෙකු වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

(v) එම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ගනු ලබන ඉදිරි ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

232/2024

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නීතිපති දෙපාර්තමේන්තුවේ කටයුතු සම්බන්ධයෙන් අගතියට පත්වන පාර්ශ්වයට සිය දුක්ගැනවිලි ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි 'විශේෂ පාර්ලිමේන්තු ඔම්බුඩ්ස්මන්වරයකු' පත් කිරීමට 'පොහොසත් රටක්- ලස්සන ජීවිතයක්' ප්‍රතිපත්ති ප්‍රකාශය මගින් පොරොන්දුවී තිබේද;

(ii) එසේ නම්, එම පොරොන්දු ප්‍රකාරව පත් කර ඇති ඔම්බුඩ්ස්මන්වරයාගේ නම සහ කාර්යාල ලිපිනය කවරේද;

(iii) මෙතෙක් එම පත්කිරීම සිදුකර නොමැති නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

466/2025

ගරු රවී කරුණානායක මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2020 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ආදායම සහ ලාභය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මේ දක්වා එම සංස්ථාවේ වෙළඳපොළ කොටසෙහි ප්‍රතිශතය සහ මුළු ශේෂ පත්‍රයේ වටිනාකම කොපමණද;

(iii) ඉහත සංස්ථාවේ තරඟකරුවන්ගේ නම් සහ ජීවිත හා සාමාන්‍ය රක්ෂණ ක්ෂේත්‍රයේ ඔවුන්ගේ වෙළඳපොළ කොටසෙහි ප්‍රතිශතය සහ සමස්තය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) 2020 වර්ෂයේ සිට මේ දක්වා සංස්ථාව විසින් වාර්ෂිකව ගෙවන ලද සෘජු හා වක්‍ර බදු ප්‍රමාණ වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඉහත සංස්ථාවේ පරිපාලිත සමාගම්වල නම් සහ ඒවා සතු කොටස් ප්‍රමාණ වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2020 වර්ෂයේ සිට මේ දක්වා වාර්ෂිකව ඉහත සංස්ථාවේ —

(i) සේවය කරනු ලබන සේවක සංඛ්‍යාව සහ ඔවුන්ගේ වැටුප් හා වේතන සඳහා වැයවූ මුළු මුදල;

(ii) ආයෝජන ප්‍රතිලාභ;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

883/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඉඩම් නොමැති පුද්ගලයන් විසින් ඉඩම් ලබා ගැනීම සඳහා 2017.01.01 සිට 2025.03.31 දින දක්වාවූ කාලසීමාවේදී කෝරළේපත්තුව, වාලච්චේන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත අයදුම් කර ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(iii) එම පුද්ගලයන්ට දීමනා ඔප්පු (Deeds of Grant) හෝ ඉඩම් බලපත්‍ර (Land permits) ලබාදී තිබේද;

(iv) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කෝරළේපත්තුව, වාලච්චේන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇති රජයේ ඉඩම්වල පදිංචිවී ඇති පුද්ගලයන්ගෙන් බහුතරයකට මේ දක්වා දීමනා ඔප්පු හෝ ඉඩම් බලපත්‍ර ලබාදී නොමැති බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(iii) එම පුද්ගලයන්ට මේ දක්වා ඉඩම් ඔප්පු හෝ ඉඩම් බලපත්‍ර ලබා නොදීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1032/2025

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ, ලග්ගල ඩිපෝව ඉදිකිරීම සඳහා මුල් ගල තබන ලද දිනය කවරේද;

(ii) එම ඩිපෝව ඉදිකිරීම සඳහා මේ වනවිට වැය කර ඇති මුදල කොපමණද;

(iii) මේ වනවිට එම ඩිපෝව සතු බස්රථ සංඛ්‍යාව කොපමණද;

(iv) මේ වනවිට එම ඩිපෝ භූමිය වල් බිහිවෙමින් තිබෙන බව දන්නේද;

(v) එම ඩිපෝව යථා තත්ත්වයට පත් කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1106/2025

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2024.10.01 දින සිට මේ දක්වා ශ්‍රී ලංකාවට ලැබී ඇති සෘජු විදේශ ආයෝජනවල මුළු වටිනාකම ඇමරිකානු ඩොලර්වලින් කොපමණද;

(ii) ඊට අදාළ ආයෝජන ව්‍යාපෘති කවරේද;

(iii) එම එක් එක් ආයෝජන ව්‍යාපෘතියේ ස්වභාවය සහ ආයෝජනය කර ඇති මුදල ඇමරිකානු ඩොලර්වලින් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම එක් එක් ආයෝජන ව්‍යාපෘතිය ආරම්භ කරන ලද දිනය/ ආරම්භ කරනු ලබන දිනය, අවසන් වන දිනය සහ එක් එක් ව්‍යාපෘතියෙන් උත්පාදනය කරනු ලබන රැකියා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම් ඒ මන්ද?

1124/2025

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සීමාසහිත කොළඹ නැව් තටාකාංගනය සමාගමේ (Colombo Dockyard PLC) අයිතිය සම්පූර්ණයෙන්ම රජය සතුව පවතින්නේද;

(ii) එම සමාගමේ තවත් කොටස්කරුවන් සිටී නම්, ඔවුන්ගේ නම් කවරේද;

(iii) රජය සහ අනෙකුත් කොටස්කරුවන් අතර පවතින කොටස් සංඛ්‍යාව ප්‍රතිශතාත්මකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) අනෙකුත් කොටස්කරුවන් සතු වත්කම්වල අගය ඩොලර්වලින් කොපමණද;

(v) වර්තමාන කොටස්කරුවන් වෙත කොටස් හිමිකම් ලබා දුන් වර්ෂ කවරේද;

(vi) ඔවුන්ට කොටස් විකිණීමේදී ටෙන්ඩර් කැඳවා තිබේද;

(vii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද එක් එක් කොටස්කරුගේ නම, ලිපිනය සහ ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(viii) එම එක් එක් කොටස්කරු මිලදී ගන්නා ලද කොටස්වලට අනුව ආයෝජනය කර ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1244/2025

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ ඇති වනජීවී කලාප එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම එක් එක් වනජීවී කලාපයට අයත් භූමි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම වනජීවී කලාප තුළ වනජීවීන් වෙනුවෙන් ඇති වැව්, අමුණු සහ විල් හඳුනාගෙන තිබේද;

(iv) එසේ නම්, එම සංඛ්‍යාව එක් එක් වනජීවී කලාපය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඉහත වනජීවී කලාප තුළ මේ වනවිට ප්‍රතිසංස්කරණය කර හෝ ඉදිකර ඇති වැව්, අමුණු සහ විල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් විද්‍යාත්මකව හඳුනාගෙන ඇති වනඅලි කොරිඩෝ කවරේද;

(ii) ඒවා ගැසට් කිරීම සඳහා පියවර ගෙන තිබේද;

(iii) එසේ නම්, මේ වනවිට ගැසට් කර ඇති වනඅලි කොරිඩෝ කවරේද;

(iv) හඳුනාගෙන ඇති වනඅලි කොරිඩෝ මේ වනතෙක් ගැසට් කර නොමැති නම්, ඊට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1472/2025

ගරු චාමර සම්පත් දසනායක මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවරයාට ලද පැමිණිල්ලකට අනුව නුගේගොඩ, ශාන්ත ජෝන් විද්‍යාලයේ විදුහල්පතිවරයාට එරෙහිව 2025.06.04 දින සිට 2025.07.04 දින දක්වා විමර්ශනයක් සිදු කරන ලද බව දන්නේද;

(ii) විමර්ශනය සිදු කරන ලද කමිටුව විසින් එම විමර්ශනය අපක්ෂපාතීව නිසි ආකාරයෙන් සිදු කර තිබේද;

(iii) එසේ නම්, එම විමර්ශන කමිටුව විසින් ඉහත විදුහල්පතිවරයා සම්බන්ධයෙන් සිදු කර ඇති නිර්දේශ කවරේද;

(iv) මේ වනවිට, එම නිර්දේශ ක්‍රියාත්මක කර තිබේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1934/2026

ගරු අජිත් ගිහාන් මහතා,— ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව යටතේ පාලනය වන ධීවර වරායන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ධීවර වරායන්හි ධීවර කර්මාන්තයට අවශ්‍ය පහසුකම් ස්ථාපිත කර තිබේද;

(iii) එම වරායන්හි බෝට්ටු අලුත්වැඩියා කිරීමේදී ඉවතලන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා වැඩපිළිවෙළක් තිබේද;

(iv) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

(v) වරායන් ආශ්‍රිතව ගොඩගසන වැලි ඉවත් කිරීමට ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

(vi) පසුගිය පාලන කාලය තුළ ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ අභිලාෂ හා අරමුණු සාක්ෂාත් කර ගැනීමට හැකිවී තිබේද;

(vii) එසේ නම්, ඒ සඳහා හේතු කවරේද;

(viii) ධීවර වරායන් සංවර්ධනය කර ධීවර ජනතාවට පහසුකම් ලබාදීමට වැඩපිළිවෙළක් තිබේද;

(ix) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

**2026 අප්‍රේල් 22 බදාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

748/2025

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බස්රථ ධාවනය සඳහා ඒකාබද්ධ කාලසටහන් ක්‍රමය මුල්වරට යෝජනා කරනු ලැබූ දිනය කවරේද;

(ii) මේ වනවිට එම ඒකාබද්ධ කාලසටහන් ක්‍රමය ක්‍රියාත්මක වන මාර්ග සංඛ්‍යාව ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(iii) එම ඒකාබද්ධ කාලසටහන් ක්‍රමය ක්‍රියාත්මක වන මාර්ගවල ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස්රථවලට අවාසි සහගත තත්ත්වයක් උද්ගතවී ඇති බව දන්නේද;

(iv) එසේ නම්, එම ක්‍රමය නැවත සමාලෝචනය කර එකී මාර්ගවල ධාවනය වන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස්රථ සඳහාද සාධාරණ අවස්ථා ලබාදීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

814/2025

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ඉදිකිරීම් ආරම්භ කරන ලද අධිකරණ සංකීර්ණ සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා ඉදිකරන ලද/ඉදිකරනු ලබන ස්ථාන කවරේද;

(iii) ඉහත අධිකරණ සංකීර්ණ අතරින් මේ වනවිට ඉදිකිරීම් අවසන් කර ඇති සංඛ්‍යාව සහ ඉදිකිරීම් අතරමඟ නවතා ඇති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉදිකිරීම් අතරමඟ නවතා ඇති අධිකරණ සංකීර්ණය කඩිනමින් ඉදිකර අවසන් කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

843/2025

ගරු මුජිබුර් රහුමාන් මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහරගම නගර සභා බලප්‍රදේශයට අයත් ඉඩමක් පසුගිය කාලයේ කුරුලු උයනක් ඉදිකිරීමේ ව්‍යාපෘතියකට ලබා දුන් බව දන්නේද;

(ii) එම ඉඩමේ විශාලත්වය කොපමණද;

(iii) එම ඉඩම ලබාගත් සමාගමේ/සමාගම්වල නම/නම් කවරේද;

(iv) මේ වනවිට ඉහත ව්‍යාපෘතිය නතරවී ඇති බව දන්නේද;

(v) මේ හේතුවෙන් සිදුවන විශාල පරිසර හානිය සහ ඉඩම් ගොඩකිරීම වැනි අනවසර කටයුතු වැළැක්වීමටත් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1015/2025

ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා,— මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අන්තර්ජාලය හරහා සිදු කරනු ලබන ලුහුබැඳීම, හිරිහැර, බියවද්දා මුදල් බලෙන් ලබා ගැනීම, අනන්‍යතා තොරතුරු සොරකම් කිරීම, එකඟතාවයකින් තොරව සංවේදී පෞද්ගලික කරුණු පළ කිරීම සහ කෘත්‍රිම බුද්ධිය අවභාවිතා කිරීම වැනි නිශ්චිත කාණ්ඩ යටතේ වර්ගීකරණය කර ඇති, කාන්තාවන් සම්බන්ධ පරිගණක අපරාධ පැමිණිලි සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) පසුගිය වසර තුන තුළ එවැනි වැරදි ක්‍රියාවල වැඩිවීමක් කිසියම් නිශ්චිත කාණ්ඩයකට අදාළව සිදුවී තිබේද;

(iii) එසේ නම්, හඳුනාගෙන ඇති මතු වෙමින් පවතින ප්‍රවණතා කවරේද;

(iv) එවැනි වැරදි ක්‍රියා, කාණ්ඩය සහ කලාපය අනුව වර්ගීකරණය කර හඳුනා ගැනීම සඳහා වෙන් වූ දත්ත රැස් කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක වන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1363/2025

ගරු තුරෛරාසා රවිකරන් මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) යම් පාසලක අවුරුදු අටකට වැඩි කාලයක් සේවය කරමින් සිටින විදුහල්පතිවරුන්ගේ සංඛ්‍යාව එක් එක් පළාත අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) විදුහල්පතිවරයෙක් එකම පාසලක අවුරුදු අටකට වැඩි කාලයක් අඛණ්ඩව සේවයේ යෙදීම හේතුවෙන් උද්ගතවී ඇති ගැටලු කවරේද;

(iii) 2012 වර්ෂයේදී අධි සේවක පදනම මත, විදුහල්පතිවරුන් ලෙස අන්තර්ග්‍රහණය කරනු ලැබ ඇති තැනැත්තන් හට උසස්වීම් ලබාදී ඇතත්, ඔවුන්ගේ සේවයට අදාළ පරිපාලන දීමනා ලබාදී නොමැති බව දන්නේද;

(iv) ඒ සඳහා ඇති බාධා කවරේද;

(v) පාසල්වල පවතින විදුහල්පති පුරප්පාඩු සඳහා, අධි සේවක පදනමේ සිටින විදුහල්පතිවරුන්ට අයදුම් කිරීමට පවතින බාධා කවරේද;

(vi) අවුරුදු අටකට වැඩි කාලයක් එකම පාසලක අධි සේවක පදනම මත සේවය කරන විදුහල්පතිවරුන්ට, ස්ථාන මාරු ලබා දීමේ හැකියාව කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1373/2025

ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) අධ්‍යාපනවේදී උපාධිය ප්‍රදානය කරනු ලබන රජයේ විශ්වවිද්‍යාල සංඛ්‍යාව, පෞද්ගලික විශ්වවිද්‍යාල සංඛ්‍යාව සහ වෙනත් උසස් අධ්‍යාපන ආයතන සංඛ්‍යාව සහ ඒවායේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) 2025.01.01 වැනි දින සිට මේ දක්වා එම එක් එක් විශ්වවිද්‍යාලයෙන්/උසස් අධ්‍යාපන ආයතනයෙන් අධ්‍යාපනවේදී උපාධිය සම්පූර්ණ කර රජයේ ගුරු සේවයට බඳවාගනු ලැබූ උපාධිධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) පෞද්ගලික විශ්වවිද්‍යාල මඟින් ප්‍රදානය කරනු ලබන අධ්‍යාපනවේදී උපාධියේ ගුණාත්මකභාවය සම්බන්ධයෙන් විශාල සමාජ කතිකාවක් ගොඩනැගී තිබෙන බව දන්නේද;

(iv) පෞද්ගලික විශ්වවිද්‍යාල මඟින් ප්‍රදානය කරනු ලබන අධ්‍යාපනවේදී උපාධිය සහ සෙසු උපාධි පාඨමාලාවල ගුණාත්මකභාවය පරීක්ෂා කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1470/2025

ගරු චානක මාදුගොඩ මහතා,— තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වෙළඳපොළ තුළ ක්‍රීඩා භාණ්ඩවල මිල ඉතා සීඝ්‍රයෙන් ඉහළ යාම හේතුවෙන් ග්‍රාමීය ක්‍රීඩකයන් දැඩි දුෂ්කරතාවයන්ට පත්වී ඇති බවත්;

(ii) ක්‍රීඩා භාණ්ඩවල මිල, ග්‍රාමීය ප්‍රදේශවල ක්‍රීඩාව සංවර්ධනය කිරීමේදී බලපාන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ක්‍රීඩකයන්ට ක්‍රීඩා භාණ්ඩ සහන මිලට ලබා දීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(ii) ක්‍රීඩා භාණ්ඩ ආනයනය කිරීම වෙනුවට ඒවා ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1736/2025

ගරු ලාල් ප්‍රේමනාත් මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගංවතුර සහ නායයෑම් ආපදා තත්ත්වයෙන් මාතර දිස්ත්‍රික්කයේ තෙලිජ්ජවිල මධ්‍ය මහා විද්‍යාලයට සහ දෙනියාය මධ්‍ය මහා විද්‍යාලයට ඇතිවූ බලපෑම පිළිබඳව නිශ්චිත වාර්තා ලැබී තිබේද;

(ii) එම ගංවතුර සහ නායයෑම් හේතුවෙන් අධ්‍යාපන කටයුතුවලට ඇතිවූ බාධා කවරේද;

(iii) මෙම තත්ත්වයන් නිරාකරණය කිරීම සඳහා විශේෂ ප්‍රතිපාදන වෙන් කර තිබේද;

(iv) එසේ නම්, එම ප්‍රතිපාදන එක් එක් පාසල අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දැනටමත් මුදල් වෙන්කර වැඩ අවසන් කර නොමැති ව්‍යාපෘතිවලට මේ යටතේ මුදල් වෙන් කර ඇති බව හඳුනාගෙන තිබේද;

(ii) එසේ නම්, එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා වගකීම් දරන ආයතන වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මෙතෙක් අවසන් කර නොමැති ව්‍යාපෘති කඩිනමින් ආරම්භ කර නිම කිරීමට අදාළ නිශ්චිත කාල රාමුවක් ඉදිරිපත් කරන්නේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1855/2026

ගරු සුනිල් රත්නසිරි මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව පිහිටුවන ලද වර්ෂය කවරේද;

(ii) ආරම්භයේදී සහ මේ වනවිට දෙපාර්තමේන්තුව සතු දුම්රිය සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ආරම්භයේ දී සහ මේ වනවිට දුම්රිය මාර්ග පද්ධතියේ මුළු දුර වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) දුම්රිය සංඛ්‍යාව හා දුම්රිය මාර්ග පද්ධතියේ මුළු දුර වර්තමානය දක්වා විකාශනය වී ඇති ප්‍රමාණය සැලකීමේදී, එම වැඩිවීම ප්‍රමාණවත් වන්නේද;

(v) නොඑසේ නම්, දුම්රිය සංඛ්‍යාව සහ දුම්රිය මාර්ග පද්ධතියෙහි දුර වැඩි කිරීම සඳහා අවධානය යොමු කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මාර්ග අනතුරු අවම කර ගැනීම සඳහා 2026 අයවැය මඟින් වෙන් කර ඇති ඇස්තමේන්තුගත ප්‍රතිපාදන කොපමණද;

(ii) පාසල් දරුවන් ප්‍රවාහනයේ දී සිදුවන අනතුරු අවම කිරීම සහ දරුවන්ට සිදුවිය හැකි අපචාර වැළැක්වීමට පවතින නියාමනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) නාගරික ප්‍රදේශවල ඇති අව්‍යිමත් ඉදිකිරීම් විධිමත් කිරීමේ වැඩපිළිවෙළක් තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1907/2026

ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අභාවප්‍රාප්ත එම්.එච්. මොහොමඩ් මහතා අමාත්‍ය ධුරය දරන කාලයේ සිට ජාතික මීලාදුන්-නබි උත්සවය දිස්ත්‍රික්ක මට්ටමෙන් සැමරීම ආරම්භ වූ බවත්;

(ii) අභාවප්‍රාප්ත ඒ.එච්.එම්. අස්වර් මහතා අමාත්‍ය ධුරය දරන කාලයේ ජාතික මීලාදුන්-නබි උත්සවය ඉතා උත්කර්ෂවත් අන්දමින් පැවැත් වූ බවත්;

(iii) ඉන් අනතුරුවද දිස්ත්‍රික්ක මට්ටමින් එම උත්සවය පැවැත් වූ බවත්;

(iv) එමඟින් නොදියුණු මුස්ලිම් දේවස්ථාන ප්‍රතිසංස්කරණය කරන ලද අතර මුස්ලිම් ගම්මානද සංවර්ධනය කර ඇති බවත්;

එතුමා දන්නනෙහිද?

(ආ) (i) 2026 වර්ෂයේ ජාතික මීලාදුන්-නබි උත්සවය පැවැත්වීමට දැනට තීරණය කර ඇති දිස්ත්‍රික්කය සහ ප්‍රදේශය කවරේද;

(ii) එම උත්සවය අරලියගහ මන්දිරයේදී පැවැත්වීමට බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවට දැනුම් දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

**2026 අප්‍රේල් 23 බ්‍රහස්පතින්දා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1184/2025

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ, තමිල්චෝලෛ විද්‍යාලය නමින් පාසලක් පැවැති බව දන්නේද;

(ii) එසේ නම්, එම පාසල ආරම්භ කරන ලද දිනය කවරේද;

(iii) එම පාසලේ සිසුන් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයට සහ 05 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයට අවසන් වරට පෙනී සිට ඇති වර්ෂ වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) මේ වනවිට ඉහත පාසලේ නාමය කවරේද;

(v) එම පාසලේ නාමය සංශෝධනය කිරීමට කටයුතු කරනු ලැබූයේ කවුරුන් විසින්ද;

(vi) ඊට හේතු කවරේද;

(vii) එම සංශෝධනය කරනු ලැබූ දිනය කවරේද;

(viii) එම පාසලේ නාමය සඳහා එම පාසලේ නිර්මාතෘවරයාගේ හෝ පාසල ආරම්භ කිරීමට පුරෝගාමීවූ පුද්ගලයෙකුගේ නමක් යොදා ගත හැකිද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1409/2025

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2009 වර්ෂයේ සිට මේ දක්වා වන්නි මැතිවරණ දිස්ත්‍රික්කයේ රැකියා අවස්ථා ලබා දීම සඳහා ආරම්භ කර ඇති රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ ආයෝජන ව්‍යාපෘති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීමට රජය විසින් ලබා දෙනු ලබන සහන කවරේද;

(iii) ආයෝජකයින්ට දුෂ්කරතාවයකින් තොරව රජයේ ඉඩම් ලබාගැනීම සඳහා සරල ක්‍රමවේදයක් හඳුන්වාදී තිබේද;

(iv) සියලු සේවා එකම ස්ථානයකින් සැපයීමට හැකි වන පරිදි දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල ආයෝජන මණ්ඩලය මඟින් විශේෂ ඒකක ආරම්භ කිරීමට සැලසුම් කර තිබේද;

(v) එසේ නම්, ඒවා ක්‍රියාත්මක කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1475/2025

ගරු රොෂාන් අක්මීමන මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ ගැසට් කර හෝ හඳුනාගෙන ඇති රක්ෂිත වනාන්තර ප්‍රමාණය සහ රක්ෂිත වනාන්තර බවට පත් කිරීමට යෝජිත වනාන්තර ප්‍රමාණය හෙක්ටයාර්වලින් කොපමණද;

(ii) දීර්ඝ කාලයක් තිස්සේ පදිංචිවී ඇති හෝ වගා කටයුතු සඳහා භාවිතා කර ඇති නමුත්, පසුව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතට ගෙන ඇති ඉඩම් ප්‍රමාණය එම දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ඉඩම්වලින් නැවත නිදහස් කිරීම සඳහා නිර්දේශ කර ඇති ඉඩම් ප්‍රමාණය එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ අලි-මිනිස් ගැටුම පාලනය කිරීම සඳහා සකස් කර ඇති වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1546/2025

ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති වතු පේළි නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම පේළි නිවාසවල ජීවත් වීමට සුදුසු පරිසරයක් පවතින බවට නිසි පරීක්ෂාවක් සිදු කර තිබේද;

(iii) අදාළ වතු සමාගම් විසින් එම පේළි නිවාස නිසි පරිදි නඩත්තු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(iv) නිසි පරිදි නඩත්තු කර නොමැති පේළි නිවාස සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1576/2025

ගරු කිට්නන් සෙල්වරාජ් මහතා,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2016 වර්ෂයේදී ඉන්දියානු රජය විසින් මලයගම් ජනතාව වෙනුවෙන් 'සිටි රයිඩර්' බස් රථ ලබා දුන් බව එතුමා දන්නේද;

(ii) එසේ නම්, එම බස් රථ සංඛ්‍යාව කොපමණද;

(iii) එම බස් රථ ලබාදීමේ අරමුණ කවරේද;

(iv) එම බස් රථ ලබා දුන් සංවිධාන සහ ඒවා ලබාගත් අමාත්‍යවරුන්ගේ නම් කවරේද;

(v) එම බස් රථවලින් බදුල්ල සහ නුවරඑළිය යන දිස්ත්‍රික්ක සඳහා ලබා දුන් බස් රථ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) එම බස් රථවල වර්තමාන තත්ත්වය කවරේද;

(vii) එම බස් රථ මේ වනවිට භාවිතා කරනු ලබන පාර්ශ්ව සහ භාවිතා කරනු ලබන කාර්යයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1637/2025

ගරු රුවන් විජේවීර මහතා,— නිවාස, ඉදිකිරීම් සහ ජලසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 'සැමට සෙවන' ව්‍යාපෘතිය යටතේ, මොනරාගල දිස්ත්‍රික්කය තුළ ඉදිකිරීමට සැලසුම් කරන ලද නිවාස සංඛ්‍යාව සහ සම්පූර්ණයෙන්ම වැඩ අවසන් කරන ලද නිවාස සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මෙම ව්‍යාපෘතිය සඳහා අරමුදල් සපයා ගන්නා ලද මූලාශ්‍රය කවරේද;

(iii) මෙම නිවාස ව්‍යාපෘතිය සඳහා, ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී යොදා ගන්නා ලද නිර්ණායක කවරේද;

(iv) මෙම ව්‍යාපෘතිය යටතේ, මොනරාගල දිස්ත්‍රික්කයේ බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ඉදිකරන ලද නිවාස සංඛ්‍යාව කොපමණද;

(v) ඒ සඳහා වෙන් කරන ලද මුදල සහ සත්‍ය වශයෙන් වැය කර ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1641/2025

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් ඩිපෝ සංඛ්‍යාව කොපමණද;

(ii) එම ඩිපෝවල නම් කවරේද;

(iii) එම ඩිපෝවල දැනට ධාවනයේ යෙදවිය හැකි තත්ත්වයේ පවතින බස් රථ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම එක් එක් ඩිපෝවල පවතින සේවක පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඩිපෝවල බස් රථ හා මානව සම්පත් වැඩිදියුණු කිරීම සඳහා මේ වනවිට ගෙන ඇති හෝ ඉදිරියේදී ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1740/2025

ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2004.12.26 දින ඇතිවූ සුනාමි ව්‍යසනය හේතුවෙන් පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ආපදාවට ලක්වූ ජනතාවට නිවාස අහිමිවූ බවත්;

(ii) එම ජනතාව සඳහා රජය සහ රාජ්‍ය නොවන සංවිධාන විසින් පුද්ගලික ඉඩම්වල සහ රජයේ ඉඩම්වල විකල්ප නිවාස ඉදිකර ලබාදී ඇති බවත්;

(iii) එම විකල්ප නිවාස, සර්වෝදයපුරම්, සෙංකාමම්, හිජ්රා නගර්, කනහර් ගම්මානය, කෝමාරි 1 සහ කෝමාරි 2 යන ග්‍රාම නිලධාරි වසම්වල පිහිටි රජයේ ඉඩම්වල ඉදි කර ඇති බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) (i) වසර 18කට අධික කාලයක් ගතවී ඇතත් මේ වනතෙක් එම ජනතාවට අදාළ ඉඩම් ඔප්පු ලබා නොදීමට හේතු කවරේද;

(ii) එම ජනතාවට කඩිනමින් ඉඩම් ඔප්පු ලබාදීම සඳහා ගෙන ඇති හෝ ඉදිරියේදී ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1789/2025

ගරු බී. ආරියවංශ මහතා,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ ඇති වතු ගම්මාන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) එම වතු ගම්මානවල ජීවත්වන පවුල් සංඛ්‍යාව එක් එක් ගම්මානය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම ගම්මානවල යටිතල පහසුකම් ඉහළ නැංවීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1939/2026

ගරු ධර්මප්‍රිය දිසානායක මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් මුළු දුම්රිය රක්ෂිත භූමි ප්‍රමාණය කොපමණද;

(ii) එම භූමිය පරිහරණය කරන ආකාරය සහ ඒ සඳහා අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(iii) දුම්රිය මාර්ගය දෙපස වෙන් කර ඇති රක්ෂිත භූමි ප්‍රමාණය කොපමණද;

(iv) එම රක්ෂිත ප්‍රදේශ ආරක්ෂා කිරීම, පිරිසිදු කිරීම සහ නඩත්තු කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(v) රක්ෂිත ප්‍රදේශ හරහා ඇති පළාත් පාලන ආයතන විසින් නඩත්තු කරනු ලබන මාර්ග සංවර්ධනය කිරීමේදී ඇතිවන ගැටලුකාරී තත්ත්වයන් පිළිබඳව දන්නේද;

(vi) එම මාර්ග පිළිසකර කිරීම සඳහා අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2026 අප්‍රේල් 24 සිකුරාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

26/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා අතරමගදී පාසල් හැර ගිය ළමුන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ළමුන් අයත් වන වයස් කාණ්ඩ කවරේද;

(iii) එම ළමුන් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ළමුන් පාසල් හැරයාමට බලපා ඇති පොදු හේතු කවරේද;

(v) ඒ සඳහා රජය මඟින් ලබා දෙනු ලබන විසඳුම් කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ගැටලුව සම්බන්ධයෙන් රජය විසින් විධිමත් අධ්‍යයනයක් සිදුකරනු ලබන්නේද;

(ii) නොඑසේ නම්, එවැනි අධ්‍යයනයක් කඩිනමින් සිදු කළ යුතු බව පිළිගන්නේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

135/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරුන්, නියෝජ්‍ය අමාත්‍යවරුන් සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා මේ වනවිට වෙන් කර ඇති බංගලා හා නිල නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් බංගලාව/නිල නිවාසය භාවිතා කරනු ලබන අමාත්‍යවරයාගේ/ නියෝජ්‍ය අමාත්‍යවරයාගේ/පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාගේ/මහජන නියෝජිතයාගේ නම හා තනතුරු නාමය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මහජන නියෝජිතයන්ට වරප්‍රසාද/පහසුකම් ලබා දීම සම්බන්ධයෙන් විශාල සමාජ විරෝධයක් ඇතිවී තිබෙන අවස්ථාවක, මහජන නියෝජිතයන්ට ඒවා ලබා දීම සම්බන්ධයෙන් රජයේ ස්ථාවරය කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1717/2025

ගරු ආර්.ජී. විජේරත්න මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2010, 2011, 2012, 2013 සහ 2014 යන වර්ෂයන්හි ජාතික ආර්ථික දත්ත විකෘති කරමින් (Data Massage) ආර්ථික සංවර්ධන වේගය හා උද්ධමන අනුපාත අගයන් වෙනස් කර ඇති බව පිළිගන්නේද;

(ii) නොඑසේ නම්, ඒ මන්ද;

(iii) වර්ෂ 2004 සිට 2014 දක්වා කාලය තුළ ශ්‍රී ලංකා ආර්ථිකයේ මූලික දත්ත වෙනස් කරමින්, ජාතික ආදායමේ වාර්ෂික වර්ධන වේගය වැඩිකර පෙන්වා දෙමින්, අඩු ආදායම් ආර්ථිකයක් කෘත්‍රිමව මවා පාමින් අධික පොලියට දේශීය හා විදේශීය ණය ගැනීමට උපක්‍රමශීලීව කටයුතු කර තිබේද;

(iv) වර්ෂ 2004 සිට 2015 දක්වා කාලය තුළ මෙම දූෂණ, වංචා සහ අක්‍රමිකතාවයන් සිදු කළ ආර්ථික ඝාතකයන් සහ 2022 වර්ෂයේදී රට බංකොලොත් වීම අතර සම්බන්ධයක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1883/2026

ගරු සුනිල් රාජපක්ෂ මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ අධ්‍යාපනවේදී උපාධිය පිරිනමන රාජ්‍ය අධ්‍යාපන ආයතන කවරේද;

(ii) එම උපාධිය පිරිනමන රාජ්‍ය නොවන අධ්‍යාපන ආයතන කවරේද;

(iii) රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතනවලින් පිරිනමන අධ්‍යාපනවේදී උපාධිය ගුරු සේවයට බඳවාගැනීමේදී සමානව සලකන්නේද;

(iv) නොඑසේ නම්, ඒ මන්ද;

(v) රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතනවලින් පිරිනමන අධ්‍යාපනවේදී උපාධි පාඨමාලා කාලය හා අන්තර්ගතය සමාන වන්නේද;

(vi) නොඑසේ නම්, ඒ මන්ද;

(vii) අදාළ ආයතන මඟින් පිරිනමන අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාවට ප්‍රායෝගික ඉගැන්වීමේ පුහුණුවක් අනිවාර්ය වන්නේද;

(viii) එසේ නම්, එම කාලය කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1885/2026

ගරු අබූබකර් අතම්බාවා මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ කාරතිවු, සායින්දමරුදු සහ කල්මුණේ වෙරළබඩ ප්‍රදේශවල පිහිටි ප්‍රාදේශීය ජලාශ අතිරේක පෝෂක හේතුවෙන් දූෂණයට ලක්ව ඇති අතර විවිධ වර්ගයේ ජලජ වල් පැලෑටි මඟින් ආක්‍රමණයට ලක්ව වැසී ගොස් ඇති බවත්;

(ii) අධික ලෙස රොන්මඩ තැන්පත් වීමෙන් එම ජලාශවල ගැඹුර අඩුවී ඇති බවත්;

(iii) ඉහත තත්ත්ව හේතුවෙන් එම ජලාශවල ජලය රඳවා ගැනීමේ ධාරිතාව අඩු වීමෙන් වර්ෂා කාලයේදී ගංවතුර ආපදා වැඩිවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත ප්‍රදේශවල පරිසර හානි සහ ජලාශවල රොන්මඩ තැන්පත් වීම සම්බන්ධයෙන් නිසි ඇගයීමක් සිදු කර තිබේද;

(ii) රොන්මඩ හා ආක්‍රමණශීලී වල් පැලෑටි ඉවත් කිරීම සහ එම ජලජ පරිසර පද්ධති තිරසර ලෙස යථා තත්ත්වයට පත් කිරීම සඳහා ඒකාබද්ධ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට සැලැස්මක් තිබේද;

(iii) එසේ නම්, ඉහත ප්‍රදේශවල එවැනි ව්‍යාපෘති ආරම්භ කිරීමට අපේක්ෂිත දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1919/2026

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, එදිරිසිංහ පාර, ගංගොඩවිල ප්‍රදේශයේ පදිංචි අනවසර පවුල් එම ප්‍රදේශයෙන් ඉවත් කර වෙනත් ප්‍රදේශයක පදිංචි කිරීම සඳහා කටයුතු යොදා ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එම පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) එම පවුල්වලින් නිවාස හිමිවන සංඛ්‍යාව කොපමණද;

(iv) එම පවුල් සඳහා කොළඹගේ මාවත හෝ කාලිංග මාවත ප්‍රදේශවල නිවාස ලබා නොදී මාලිගාවත්ත ප්‍රදේශයෙන් නිවාස ලබාදීමට කටයුතු කරනු ලබන බව දන්නේද;

(v) එසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1924/2026

ගරු දේවානන්ද සුරවීර මහතා,— විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ දිස්ත්‍රික්කය තුළ විදේශගත ශ්‍රමික පවුල්වලට අයත් පාසල් යන දරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම දරුවන් සඳහා පාසල් උපකරණ ලබාදීමේ වැඩසටහනක් ක්‍රියාත්මක වන්නේද;

(iii) එසේ නම්, එය ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් ක්‍රියාත්මක වන්නේද;

(iv) ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්තව සේවය කරනු ලබන විදේශ සේවා නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(v) එකී නිලධාරීන් විසින් වාර්තා කර ඇති ආකාරයට වයස අවුරුදු 2-5, 6-10 සහ 11-18 දරන කාණ්ඩවල පාසල් දරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) 2025 වර්ෂය සඳහා ලබාදී ඇති පාසල් උපකරණ ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් ලබා දෙන දත්ත මත ඉහත තොරතුරු ඇතුළත් වාර්තාවක් ඉහත අ(iv)හි සඳහන් නිලධාරීන්ට ලබා ගැනීමේ හැකියාවක් තිබේද;

(ii) පාසල් උපකරණ ලබාදීම ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථා තිබේද;

(iii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් පවතින නිර්ණායක කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1926/2026

ගරු ටී.කේ. ජයසුන්දර මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ නාගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 'ඇප්තොප් වත්ත' රජයේ ඉඩමක් බව පිළිගන්නේද;

(ii) එම ඉඩම අතීතයේ සිට මේ දක්වා පවරා ඇති ආකාරය කවරේද;

(iii) එම ඉඩමේ බිම් ප්‍රමාණය කොපමණද;

(iv) මේ වනවිට මෙම ඉඩමේ පදිංචිකරුවන් සංඛ්‍යාව කොපමණද;

(v) එම පදිංචිකරුවන් විසින් භුක්ති විඳින බිම් ප්‍රමාණය කොපමණද;

(vi) පදිංචිවී නොමැති, වගා කටයුතු පමණක් සිදු කරන සංඛ්‍යාව කොපමණද;

(vii) ඔවුන් භුක්ති විඳින බිම් ප්‍රමාණය කොපමණද;

(viii) ඉහත ඉඩමේ දළ සැලැස්ම ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත ඉඩම තුළ ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය මඟින් හඳුනාගෙන ඇති අවදානම් කලාප පිහිටා තිබේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1931/2026

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කළමනාකරණය සඳහා පෞද්ගලික සමාගම්වලට බදුදී ඇති, රජය සතු හෝ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව යටතේ ඇති මුළු වැවිලි වතු සංඛ්‍යාව කොපමණද;

(ii) එම පෞද්ගලික සමාගම්වල නම් සහ බදුදී ඇති වැවිලි වතුවල නම් කවරේද;

(iii) බදුදී ඇති එම එක් එක් වතුයායෙහි බදු කාලය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම එක් එක් වතුයායෙහි සේවය කරන මුළු සේවක සංඛ්‍යාව සේවක කාණ්ඩය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මාර්ග, කර්මාන්තශාලා සහ ලයින් කාමර ඇතුළුව ඉහත එක් එක් වතුවලට අයත් මුළු ඉඩම් ප්‍රමාණය ශ්‍රී ලංකාවේ ඇති වතුවලට අයත් මුළු වැවිලි ඉඩම් ප්‍රමාණයෙහි ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(ii) පසුගිය මූල්‍ය වර්ෂ පහ (05) තුළ එම එක් එක් පෞද්ගලික සමාගම විසින් ලැබූ ලාභය හෝ අලාභය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඒ සම්බන්ධයෙන් විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන තිබේද;

(iv) එසේ නම්, එම මූල්‍ය ප්‍රකාශන පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1938/2026

ගරු ක්‍රිෂ්නන් කලෛයිචෙල්වි මෙනෙවිය,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1998 වර්ෂයේ සිට මේ දක්වා වතු කම්කරුවන්ගේ වැටුප් වැඩි කිරීම කලින් කලට සිදු කර ඇති ආකාරය කවරේද;

(ii) දැනට ස්ථිර සේවයේ සහ තාවකාලික සේවයේ යෙදී සිටින වතු කම්කරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2026 අයවැයෙන් වැඩි කළ වතු කම්කරු වැටුපට හිමිකම් ඇති වතු කම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(iv) වැටුප් වැඩි කිරීමෙන් පසු මේ දක්වා එම පිරිසට ගෙවා ඇති මුදල කොපමණද;

(v) වැඩි කළ වතු කම්කරු වැටුප තාවකාලික සේවයේ යෙදී සිටින වතු කම්කරුවන්ට ලබාදීමට කටයුතු කර තිබේද;

(vi) නොඑසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?